*සැ. යු.* -මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2006 වර්ෂයේ ජනවාරි-මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,612 - 2009 ජූලි මස 24 වැනි සිකුරාදා - 2009.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1050 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1051 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1061 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජූලි මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජූලි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 246

**ජාතික ශිෂ්‍යභට බළකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට මේජර් වශයෙන් ෑ
නි/3039 කපිතන් (තාවකාලික මේජර්) කේඑම්පීඑම් උනන්තැන්න (ගැ)
නි/3123 කපිතන් (තාවකාලික මේජර්) ජේකේඩීආර් ජයවර්ධන
නි/3135 කපිතන් (තාවකාලික මේජර්) ටීඒඩීආර්පී ද අල්විස්
නි/3481 කපිතන් (තාවකාලික මේජර්) යූඩබ්ඒඩබ්කේ සෙනෙවිරත්න
නි/3675 කපිතන් (තාවකාලික මේජර්) ආර්බීඑම්එම් රාමනායක (ගැ)
නි/3942 කපිතන් (තාවකාලික මේජර්) කේ සෙනෙවිරත්න
නි/4040 කපිතන් (තාවකාලික මේජර්) එස්ඒඑන්ඩී සියඹලාපිටිය

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාපක්ෂ, ආර්ඩබ්පී. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009,
කොළඹ දී ය.

07-674

---

2009 අංක 247

D/RF/824/NY/3/3

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2008 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් වශයෙන් ෑ

කොමාණ්ඩර් (නාසෙ) කොග්ගල ලියනගේ උපුල් නිශාන්ත, ශ්‍රීලංනාහ - එන්ආර්පී 0373
කොමාණ්ඩර් (නාසෙ) මාරික්කු ප්‍රනාන්දුලාගේ අභය කුමාර ද සිල්වා, ශ්‍රීලංනාහ - එන්ආර්පී 0377
කොමාණ්ඩර් (සංඥා) අධිකාරි ආරච්චිගේ රෝහිත කමලජීව පෙරේරා, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0508
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) කස්තුරි ආරච්චිලාගේ සනත් උත්පොල, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0365
කොමාණ්ඩර් (අවි) දසනායක කන්කානමලාගේ පියරත්න දසනායක, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0398
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) යලත් මුදියන්සේලාගේ ගුණසිරි බණ්ඩාර ජයතිලක, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0522
කොමාණ්ඩර් (අවි) අරම්බදුගේ කලණ මිත්ත ජිනදාස, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0389
කොමාණ්ඩර් (ටැස්) අජන්ත සුරේෂ් එදිරිවීර, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0387
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ගල්ඒදන්ඩේ ඒකනායක වාසල මුදියන්සේලාගේ අනුර නිශාන්ත ඒකනායක, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0390
කොමාණ්ඩර් (මාළිමා) සුනිල් බන්දුල සේනාරත්න, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0524
කොමාණ්ඩර් (සිඉ) අතාවුදගේ සුසිල කුමාර සේනාධීර, ශ්‍රීලංනාහ - එන්ආර්සී 0755
කොමාණ්ඩර් (අවි) පොන්නහෙන්නදිගේ ධම්මික සංජීව ඩයස්, ආර්එස්පී යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0393
කොමාණ්ඩර් (සංඥා) කපිල උබේසේකර, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0394
කොමාණ්ඩර් (විආ) සේනක හංවැල්ල, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්ආර් 0402

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

07-633

---

2009 අංක 248

D/RF/824/NY/2/4

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2008 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කොමාණ්ඩර් වශයෙන්

ලුතිනන් කොමාණ්ඩර් (අවි) මුහන්දිරම්ලාගේ මොහොමඩ් අක්රම් අලවි, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0638
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) සොමිරන්ජන් දිල්රුක් පතිරණ, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0646
ලුතිනන් කොමාණ්ඩර් (නැබ) කංකානම් දූරගේ ආනන්ද ජගත් සිරිවර්ධන, ශ්‍රීලංනාහ - එන්ආර්එච් 0677
ලුතිනන් කොමාණ්ඩර් (සැ) ජගත් ගුණසේකර, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0679
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) ප්‍රසාද් සත්‍යජිත් ප්‍රභාරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0726
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) ගල්හේන අප්පුහාමිලාගේ දොන් දීපාල් සමන්ත සමරනායක, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0644
ලුතිනන් කොමාණ්ඩර් (සැ) අසේල කැලුම් බුලත්සිංහල, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0634
ලුතිනන් කොමාණ්ඩර් (සැ) ජගත් චන්දන ලියනගමගේ, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0632
ලුතිනන් කොමාණ්ඩර් (සැ) මාරපන වලව්වේ විජිත මාරපන, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0635
ලුතිනන් කොමාණ්ඩර් (වි) කරුණාතිලක මුදියන්සේලාගේ මහේන්ද්‍ර ප්‍රදීප් කරුණාතිලක, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0648
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) උපාලි ජීවානන්ද ජයතිස්ස, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0727
ලුතිනන් කොමාණ්ඩර් (වි) ජනක උෂාන් ගුණසීල, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0733

ලුතිතන් කොමාණ්ඩර් (අවි) කෝනාර මුදියන්සේලාගේ ගමගෙදර නලින් චමින්ද නවරත්න, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0641

ලුතිතන් කොමාණ්ඩර් (එන්ඩී) ප්‍රියාල් නිශාන්ත විතානගේ, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0717

ලුතිතන් කොමාණ්ඩර් (අවි) මහමුදලිගේ හර්බ් නිශාන්ත පීරිස්, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0719

ලුතිතන් කොමාණ්ඩර් (අවි) බස්නායක මුදියන්සේලාගේ කිර්ති කුමාර බස්නායක, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0720

ලුතිතන් කොමාණ්ඩර් (එන්ඩී) අබේසිංහ ආරච්චිගේ අනුර රෝහිත අබේසිංහ, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0723

ලුතිතන් කොමාණ්ඩර් (සැ) කුලපති තන්තිරිගේ දොන් ප්‍රදීප් චමින්ද ජයපාල, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0738

ලුතිතන් කොමාණ්ඩර් (වි) රණසිංහ ආරච්චිගේ දොන් අරුණ කුමාර රණසිංහ, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0649

ලුතිතන් කොමාණ්ඩර් (තොතා) මාලා ළමාහේවා, ශ්‍රීලංනාහ - එන්ආර්ටී 0551

ලුතිතන් කොමාණ්ඩර් (ඉ) කැකුනෙවෙලමලවීරගේ දොන් හර්ෂජිත් පෙරේරා, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0725

ලුතිතන් කොමාණ්ඩර් (ඉ) චින්තක දිල්රුක්ෂණ රාජපක්ෂ, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0728

ලුතිතන් කොමාණ්ඩර් (සිඉ) හිරාන් සවින්ද්‍ර බාලසූරිය, ශ්‍රීලංනාහ - එන්ආර්සී 0730

ලුතිතන් කොමාණ්ඩර් (වි) ලොකු මරක්කලගේ හර්ෂ ද සිල්වා, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0731

ලුතිතන් කොමාණ්ඩර් (වි) ජගත් හේවගේ, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0734

ලුතිතන් කොමාණ්ඩර් (වි) උපුල් ප්‍රසන්න කරවිට, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0735

ලුතිතන් කොමාණ්ඩර් (වි) පාලින්ද අමල් විජේරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0736

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

07-634

---

# රජයේ නිවේදන

එල්. ඩී. බි. 277/40

**(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වැනි වගන්තිය යටතේ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන වන මා විසින් මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා "ආරක්ෂක ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

පුරාවස්තු ආඥාපනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව ඉහත කී ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම 2009, මැයි මස 29 වැනි දින අංක 1604 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

සංස්කෘතික කටයුතු සහ ජාතික
උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2009 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ස්මාරක ලේඛනය

*කෑගල්ල දිස්ත්‍රික්කය*

01. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිගනකන්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කෙම්පිටිකන්ද බෝධිරුක්ඛාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය

02. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගලදෙනිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වැතැන්න ග්‍රාමයට අයත් ශ්‍රී ශෛලවිවේකාරාමය හෙවත් පන්සල් වත්ත නමින් හඳුන්වන ඉඩමේ ඇති ලෙන් ලිපිය සහිත කටාරම් කෙටූ ලෙන, කටාරම් සහිත අනෙකුත් ලෙන් සහ ගලෙහි කෙටූ පියගැට පෙළ

03. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සැළව බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සැළව විහාර භූමිය ආසන්නයේ ගල්තලාව මත ඇති පර්වත ලිපිය.

04. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙල්ගමුව කෝවිලේවත්ත නමැති ස්ථානයේ දේවාලයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන කටාරම් සහිත ගල්ලෙන

05. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැදිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දැදිගම මහවලව්ව නමින් හඳුන්වන ගොඩනැගිල්ල සහ ඒ ආසන්නයේ ඇති ශිලාලේඛනය සහිත ගල්කණුවක් ඇති පැරණි ගොඩනැගිල්ල.

06. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අල්පිටිය ග්‍රාමයට අයත් පැරණි සිතුවම් සහ මූර්ති සහිත කටාරම් කෙටූ ලෙන.

07. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුවක ග්‍රාම නිලාධාරි වසමේ පිහිටි උඩුවක ග්‍රාමයේ ඇති පුරාණ ගල්ලෙන් රජමහා විහාරය භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය.

08. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඒබිඩිගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඒබිඩිගල ග්‍රාමයට අයත් මහතුලාගල කටාරම් සහිත ගල්ලෙන.

09. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වේරගල පුරාණ ශ්‍රී වර්ධනාරාම විහාර භූමියට අයත් පර්වත ලිපිය සහ කණු වලවල් සහිත ස්ථානය.

10. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෝනගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බිබිලි ඔය ඓතිහාසික පිළිම ලෙන විහාර භූමියට අයත් කටාරම් කෙටූ ලෙන් ලිපිනය සහිත ලෙස සහ කටාරම් පමණක් සහිත ලෙන් දෙක

11. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්පාත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සෝනගිරි ගල්ලෙන් තපෝවන භූමියට අයත් ලෙන් ලිපිය සහිත කටාරම් කෙටූ ලෙන

12. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කීරහේන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කීරහේන පුරාණ විහාර භූමිය තුළ පිහිටි කටාරම් සහිත ලෙන් විහාරය

*රත්නපුර දිස්ත්‍රික්කය*

13. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සන්නස්ගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සන්නස්ගම කිරිවැල්දෙණිය පුරාණ විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහයේ මකර තොරණ සහිත ඉදිරිපස බිත්තිය.

14. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්පාය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බිසෝකොටුව ගමේ වෙහෙරබින්දයාය නමැති ස්ථානයේ ඇති නටබුන් වූ දාගැබ, පෞරාණික ගොඩනැගිලි සංකීර්ණය හා ශෛලමය වට ප්‍රාකාර බැම්ම ඇතුළත් භූමිය.

15. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනතිරියන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කනතිරියන්වල ශාන්ත අන්තෝනි රෝමාණු කතෝලික දෙව්මැදුරෙහි ඇති පැරණි දෙව්මැදුරු ගොඩනැගිල්ල.

*මහනුවර දිස්ත්‍රික්කය*

16. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිමල්වත්ත, පල්ලේගම අංක 633 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අමුණුගම දෙගල්දොරුව රජමහා විහාර භූමියට අයත් පැරණි පොහොය ගෙය, සංඝාවාසය සහ බෝධි ප්‍රාකාරය.

17. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 356 කොලුගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොලුගල රාජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, චෛත්‍යය, ප්‍රතිමා ගෘහයට පිවිසීමට ඇති පියගැට පෙළ සහ ශිලා ලිපිය.

18. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 270 අම්පිටිය උඩගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දළුක්ගොල්ල ග්‍රාමයට අයත් දළුක්ගොල්ල රජමහා විහාර භූමියේ ඇති ප්‍රතිමා ගෘහය සහ සංඝාවාසය.

19. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 හිඳගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හිඳගල ලෙන් රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය, කටාරම් කෙටූ ලෙන් දෙක සහ ශිලා ලිපි

20. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැදවල රාජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය, පොහොය ගෙය, පුවරු ලිපිය හා පර්වත ලිපිය, වාහල්කඩ, දාගැබ සහ නව ප්‍රතිමා ගෘහය තුළ ඇති බුද්ධ ප්‍රතිමාව

21. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අත්තරගම (පට්ටියවත්ත) ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පට්ටියවත්ත රජපිහිල්ල.

22. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උරුලෑවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල්ලෑන්ගොල්ල පොත්ගුල් විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන්, තෙමහල් ප්‍රතිමා ගෘහය, චෛත්‍ය, ධර්මශාලාව සහ පැරණි පියගැට පෙළ.

23. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොරගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දොරගමුව ශෛල පබ්බතාරාම විහාර භූමියට අයත් දෙමහල් ධර්මශාලාව සහිත ටැම්පිට විහාරය, මැදමිදුල සහිත සංඝාවාසය, චෛත්‍ය පිහිටි ගලේ කෙටූ පියගැට පෙළ හා කණුපාදම්.

*මාතලේ දිස්ත්‍රික්කය*

24. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 433ඩී මීවලපතහ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙහෙරබැඳියාය පුරාණ විහාර භූමියේ ඇති පැරණි ගල්කණු සහිත ගොඩනැගිලි ස්ථාන, චෛත්‍ය ගොඩැල්ල සහ විහාර භූමියට නිරිත දිශාවෙන් පිහිටි බේලියකන්ද නමැති කන්දේ නැගෙනහිර බෑවුමේ ඇති කටාරම් සහිත ලෙන, පර්වත ලිපි දෙක, පියගැට පෙළ.

25. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පඩිවිට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පඩිවිට අම්බලම.

26. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරගහපිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරගහපිටිය කිතුල්වත්ත කුඩාරිදීලෙන් රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය ඇතුළු කටාරම් කෙටූ සියලුම ලෙන්.

27. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගහතැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රෙඩ්බානාගම වරකන්ද ගෘෆ් වතු බංගලාව

28. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 336 ඊ උඩස්ගිරිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි උඩස්ගිරිය බෝධිමළු විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය.

29. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පදියපැළැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පදියපැළැල්ල බෙලිහුල්ඔය හරහා ඉදිකර ඇති පදියපැළැල්ල පාලම.

*මාතර දිස්ත්‍රික්කය*

30. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නරවැල්පිට දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තෝරාවිට පුරාණ විහාර භූමියට අයත් පැරණි සිතුවම් සහ මූර්ති සහිත ටැම්පිට විහාරය සහ ආවාස ගෙය.

31. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොටුව තුළ පිහිටි විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත වරිපනම් අංක 31 දරන ස්ථානයේ ඇති පැරණි නිවස.

32. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සිරිධම්මාරාම පාරේ ඇති පැරණි වළව්ව.

33. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොටුව හරස් පාරේ පිහිටි කෝස්ට්වීච් ගොඩනැගිල්ල.

34. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කොටුව ග්‍රාම නිලධාරී වසමේ කොටුව තුළ පිහිටි ශ්‍රී ධර්මාරාම පාරේ ජැම්සන්ගහගෙදර නමැති ස්ථානයේ ඇති ප්‍රභූ නිවස.

35. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොටුව තුළ ඇති විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ වරිපනම් අංක 42 දරන ස්ථානයේ ඇති පැරණි නිවස.

36. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කොටුව ග්‍රාම නිලධාරී වසමේ කොටුව විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ පිහිටි යුධහමුදා කඳවුරු භූමියට අයත් ආණ්ඩුකාර නිල නිවස.

37. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කැටි කන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රොටුඹ බුදුගල රජමහා විහාර භූමියේ ඇති කටාරම් සහිත ලෙන් විහාර දෙක

38. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දම්පහළ බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දම්පහළ විලයාය පුරාණ රජමහා විහාර භූමියේ ඇති ටැම්පිට ප්‍රතිමා ගෘහය.

39. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොලොක්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මොලොක්ගමුව තුන්බැවුල විජයබාහු රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය.

40. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 240ඒ කොළවෙනිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොළවෙනිගම රජමහා විහාර භූමිය ආසන්නයේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය, බෝධිඝරය සහ ප්‍රාකාරය සහිත නටබුන් වූ විහාර මළුව.

41. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බමුණුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බමුණුගම රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය.

42. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිත්සිරිපුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පල්ලාවෙල කීර්ති ශ්‍රී තේජෝවනාරාම විහාර භූමියට අයත් පැරණි පිරිත් මණ්ඩපය සහිත ධර්මශාලාව සහ පැරණි සංඝාවාස ගොඩනැගිලි දෙක.

43. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරන්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේතැන්න ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි සංඝාවාසය.

44. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගල බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රුවන්කන්ද රජමහා විහාර භූමියේ ඇති කටාරම් සහිත ලෙන් විහාරය.

45. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිබ්බොටුවාව උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගොඩපිටිය ශ්‍රී සුධර්ශනාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

46. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌරුමුත්ත රජ්ජුරුබණ්ඩාර දේවාල භූමියේ ඇති ශිලාලේඛනය සහ කටාරම් සහිත ලෙන් විහාරය.

*කුරුණෑගල දිස්ත්‍රික්කය*

47. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 489 දොළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දොළුවවත්ත නමැති ස්ථානයේ ඇති කටාරම් සහ බ්‍රාහ්මී අක්ෂර කෙටූ සියලුම ලෙන්, ශෛලමය පියගැට පෙළ, ජලකාණු, ස්ථූපය සහ ගල්කණු කඩාගත් ස්ථානය.

48. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 726 හැගව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හැගව තෝරයාය තාඹුගල ටැම්පිට විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

49. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හංවැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේගොඩ සංවැලි රජමහා විහාර භූමියට අයත් පැරණි ලෙන් විහාරය.

50. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඒදණ්ඩාවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඒදණ්ඩාවල රජමහා විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

51. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1569 ඉහළ මැද්දේපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැද්දෙපොල වේරමුණේ ශ්‍රී සුන්දරාරාමය හෙවත් මැද්දේපොල රජමහා විහාර භූමියට අයත් බ්‍රාහ්මී අක්ෂර සහ කටාරම් සහිත ලෙන් විහාරය, සංඝාවාසය, පොහොය ගෙය, පැරණි ධර්ම ශාලාව සහ කටාරම් සහිත ලෙන.

52. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1546 ඉහළ ගලයාය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගලයාය ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

53. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 532 යටත්තාවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යටත්තාවල බෝධිවංශාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ හේවිසි මණ්ඩපය.

54. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුගම්පල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ලිහිණියගල්ල සාලිය රජමහා විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

55. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1584 තලම්මැහැර ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාාර භූමියට අයත් ටැම්පිට විහාරය

56. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1501 බුන්නැහැපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බුන්නැහැපොල ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාර භූමියට අයත් පෞරාණික ප්‍රතිමා ගෘහයේ අත්තිවාරම සහ ප්‍රාකාරය.

57. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1162 මූකලන්යාය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සිල්වත්තැන්න ග්‍රාමයේ ඇති ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් ඉඩමේ පිහිටි පර්වත ලිපිය.

58. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1164 කොන්ගහගෙදර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෝන්ගහගෙදර ශ්‍රී බෝධිද්‍රාමාරාමය විහාර භූමියට අයත් ටැම්පිට විහාරය

59. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1101 කැටවලේ ගෙදර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැදගොඩවත්ත උයනේගම ශ්‍රී නාගබෝධි පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

60. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1149 දීයාවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අන්නරුව ශ්‍රී විජයසුන්දරාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ධර්ම ශාලාව, සංඝාවාසය, ශිලාලේඛන දෙක.

61. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1139 ගනන්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනන්ගමුව පූර්වාරාම විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

62. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1140 කෝදුරුවාපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෝදුරුවාපොල රජමහා විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

63. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරගස්වැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මඩුවේගල ආරණ්‍ය සේනාසන භූමියට අයත් ගිරිලිපිය, ගල්කණු මණ්ඩිය සහ කටාරම් කෙටූ ලෙන්.

64. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 226 ගලඅඹගස්වැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අඹගස්වැව පුරාණ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

65. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිදුරුවැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්මලේ විහාර භූමියට අයත් ලෙන් විහාරය.

66. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 767 සේරුවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සේරුවැව යක්ගිරිලෙන් විහාර භූමියට අයත් ලෙන් විහාරය සහ කටාරම් ලෙන් දෙක.

67. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සංගප්පාලය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සංගප්පාලය වේදසගිරි ආරණ්‍ය සේනාසන භූමියට අයත් කටාරම් කෙටූ සියලුම ලෙනස් සහ ලෙන් විහාරය.

68. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලස්සනගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුඩුපුලන්චිය පුරාවිද්‍යා භූමියේ ඇති කටාරම් සහිත ලෙන්, බෝධිඝරය සහ අනෙකුත් පුරාවස්තු.

69. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 376 කනෝයාය කහටවිලගෙදර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වර්ණබිම්බාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට ප්‍රතිමා ගෘහය, තේවා මණ්ඩපය සහ ප්‍රාකාරය.

70. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1040 සිරිගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුරාණ විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

71. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 358 නියදවනේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නියදවනේ රජමහා විහාර භූමියට අයත් පෞරාණික චෛත්‍යය හා කටාරම් කෙටූ ගල් ලෙන්.

72. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 373 අගාරේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පාලගම නයන්දනව රජමහා විහාර භූමියට අයත් ලෙන් විහාරය සහ කටාරම් කෙටූ සියලුම ලෙන්.

73. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපත්වැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හිරිපත්වැල්ල මයුරාවතී ශ්‍රී බෝධිරාජාරාම පුරාණ රජමහා විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය.

74. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 923 කොල්ලුරේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොල්ලුර ග්‍රාමයට අයත් කොල්ලුරාකන්ද නමැති කන්දේ ගිණිකොණ දිශානුගත බෑවුමේ ඇති කටාරම් කොටන ලද ලෙන.

75. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 956 වදාකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇඹලේපොල ග්‍රාමයට අයත් ඇල්ලේවල ගල්කන්ද නමැති කන්දේ ඇති ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ගුහා ආවරණය,

කණු සිදුරු සහිත ගල්කුල, නටබුන් ගොඩැල්ල, පිහිටිගලේ කෙටූ පියගැට පෙළ සහ කාණු සහිත ගල්තලාව.

76. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 923 කොල්ලුරේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොල්ලුරේ වළගම්බා පුරාණ විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන් දෙක, සංකේත සටහන් කොටා ඇති ගල්කුල සහ අනෙකුත් පුරාවස්තු.

77. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 925 ආරගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ආරගොඩ ගලගාවවහේන නමැති ඉඩමේ ඇති කටාරම් කෙටූ ලෙන.

78. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෝරුගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුහුරිය ශ්‍රී අරහත්ත මලියදේව රජමහා විහාර භූමිය තුළ ඇති කටාරම් කෙටූ ලෙන සහ ලෙන් විහාරය, චෛත්‍යය.

79. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද්දලන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යෝගමුවාකන්දේ නැගෙනහිර පස බැලුම්ගල අංක 935 මාළිගාතැන්න නමැති ස්ථානයේ ඇති පර්වත ලිපිය, පිහිටි ගලේ කැපූ කාණුව සහ පියගැට පේළි.

80. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේගොඩ ශ්‍රී පුෂ්පාරාම විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

81. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද්දලන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යෝගමුවාකන්ද බැලුම්ගල ශ්‍රී සමාධි ධර්මායතන භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන සහ නටබුන් වූ ස්තූපය.

82. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙවටේගෙදර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙවටේගෙදර වෙලේ අම්බලම.

83. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇගල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇගල්ල බුදුගලහේන නමැති ස්ථානයේ ඇති කටාරම් කෙටූ ලෙන.

84. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපත්වැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇවරියගල ගල්තලාවේ ඇති නටබුන් ගොඩැල්ල සහ පොකුණු දෙක.

85. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපත්වැල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සපුගස්කන්ද, ශ්‍රී විජයසුන්දරාරාම රජමහා විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය.

86. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1042 දඹදෙණිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කපුවත්ත දේවාල නටබුන්.

*පුත්තලම දිස්ත්‍රික්කය*

87. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 499ඒ කුද්දෙටියාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කුද්දෙටියාව ශ්‍රී සුනන්දාරාම විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව සහ පොහොය ගෙය.

*කොළඹ දිස්ත්‍රික්කය*

88. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉබ්බන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යූනියන් පෙදෙස අංක 393 දරන ස්ථානයේ පිහිටි කොළඹ තරුණ ක්‍රිස්තියානි කාන්තා සමාජයට අයත් "ශාන්ත ජේම්ස් " යනුවෙන් හැඳින්වෙන පැරණි ගොඩනැගිල්ල.

*අම්පාර දිස්ත්‍රික්කය*

89. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, එරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටිගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දීඝවාපිය කොටිගල නමැති ස්ථානයේ ඇති බ්‍රාහ්මී අක්ෂර සහ කටාරම් සහිත ලෙන.

*අනුරාධපුර දිස්ත්‍රික්කය*

90. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 477 ගල්නෑව ගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල්නෑව රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය.

91. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 391, පලුගස්වැව ගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි එප්පාවෙල ගල්කන්ද පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් දෙක.

92. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 547, ඉදිගහවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තම්මැන්නාගල රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන්, ගිරිලිපිය සහ චෛත්‍ය ගොඩැල්ල.

93. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 408, තිස්සපුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල්යාය නමැති ස්ථානයේ ඇති ඉපැරණි දාගැබ සහ කටාරම් ලෙන් දෙක.

94. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 368, නෙළුම්විල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රුවන්මඩුව කටාරම් සහිත ලෙන්

95. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 674, පැල්බැදියාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කිණිහිර වෙහෙර කටාරම් සහිත ලෙන්.

96. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 418, තඹුත්තේගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හීනුක්ගල ඉපැරණි දාගැබ් ගොඩැල්ල.

97. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 415, මකුළෑව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මකුළෑව පුරාණ රජමහා විහාර භූමියට අයත් පැරණි දාගැබ, පිළිමගෙය සහ පොකුණු හතර.

98. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498, සංගම්වැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුලියන්කුලම පධානඝර ගොඩනැගිල්ල.

99. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 519, ඉහළකාගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තෝනිගල ගල්වැටියේ ඇති ගිරි ලිපිය.

100. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 519, ඉහළකාගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉහළකාගම ගල්වැටියේ බටහිර කෙළවරේ ඇති කටාරම් සහිත ලෙන්.

101. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 507, අලිවංගුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල්ලෙන් රජමහා විහාර භූමියේ ඇති බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කෙටූ ලෙන්.

102. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 499, පුලියන්කුලම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අත්නාසිගල රජමහා විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන් දෙක.

103. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 507, ගල්වංගුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තම්මැන්නා කන්ද පුරාණ විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන්.

104. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 326, කටුපත්තෑව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පානික්කන්කුලම වැවේ පැරණි සොරොව්ව.

*ගාල්ල දිස්ත්‍රික්කය*

105. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදකීඹිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැදකීඹිය ශ්‍රී ක්ෂෙත්‍රාරාම පුරාණ විහාර භූමියේ ප්‍රතිමා ගෘහයේ ඇති පෞරාණික සිතුවම් හා මූර්ති සහිත ගර්භ ගෘහය.

*ගම්පහ දිස්ත්‍රික්කය*

106. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වැකේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 413, මල්වාන ග්‍රාම නිලධාරී වසමේ මල්වාන ග්‍රාමයේ පිහිටි නාරංගස්කොටුව නමැති ස්ථානයේ ඇති මල්වාන බලකොටුව.

07-706

---

මගේ අංකය : සීඑච්/ඕ/5681.

**1988 අංක 04, 1988 අංක 80, 1980 අංක 56, 1977 අංක 09, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 8(4) වගන්තිය යටතේ සතු කිරීමේ නිවේදනය**

1988 අංක 04, 1988 අංක 80, 1980 අංක 56, 1977 අංක 09, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන පනත්වලින් සංශෝධිත 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 8(4) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ජාතික නිවාස කොමසාරිස් ලූකස් ඉඳුරුගල්ල වන මම, මෙහි පහත උපලේඛනයෙහි විස්තරාත්මකව දක්වා ඇති නිවාස 1998.02.17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනය මගින් ජාතික නිවාස කොමසාරිස් සතු කරමි.

ලූකස් ඉඳුරුගල්ල,
ජාතික නිවාස කොමසාරිස්.

2009 ජූලි මස 03 වැනි දින,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| 1. | වරිපනම් අංක | 50 | කිව් පාර | කොළඹ 02 |
| 2. | " | 54 | " | " |
| 3. | " | 56 | " | " |
| 4. | " | 58 | " | " |
| 5. | " | 60 | " | " |
| 6. | " | 62 | " | " |
| 7. | " | 64 | " | " |
| 8. | " | 66 | " | " |
| 9. | " | 56/6 | " | " |
| 10. | " | 56/8 | " | " |
| 11. | " | 56/9 | " | " |
| 12. | " | 56/11 | " | " |
| 13. | " | 56/12 | " | " |
| 14. | " | 56/23 | " | " |
| 15. | " | 56/24 | " | " |
| 16. | " | 56/25 | " | " |
| 17. | " | 56/26 | " | " |
| 18. | " | 56/27 | " | " |
| 19. | " | 56/28 | " | " |
| 20. | " | 56/29 | " | " |

| | | | | |
|---|---|---|---|---|
| 1. | වරිපනම් අංක | 06 | බැරැක්ස් ලේන් | කොළඹ 02 |
| 2. | " | 11 | " | " |
| 3. | " | 15 | " | " |
| 4. | " | 17 | " | " |

07-627

---

**තැපැල් කාර්යාලයීය ආඥාපනතේ 45 වැනි වගන්තිය (190 වැනි අධිකාරය) යටතේ කරනු ලබන නිවේදනය**

1999.01.01සිට 2000.12.31 වැනි දින දක්වා නිකුත් කළ මුදල් ඇණවුම්

මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කළ මාසයේ අවසන් දින සිට මාස 06කි. එහෙත් වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ

අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු 02ක් ඉක්ම ගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට නුපුලුවන. එවැනි මුදල් ඇණවුම්වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත් පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු 02ක් ඉක්ම ගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාළ ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

(i) මුදල් ඇණවුම් අධිකරණය වෙත ඉදිරිපත් කොට තිබීම ;

(ii) නීතිමය හේතූන් මත ගෙවල් කුලි පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම් රඳවා ගෙන තිබීම ;

(iii) මුදල් ඇණවුමේ මුදල, ලැබිය යුතු අය විදේශ ගත වී සිටීම (විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය) ;

(iv) මුදල් ලැබිය යුතු අය දීර්ඝ කාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්ත්වයකින් පසුවීම (රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය)

03. ඉහත 2 (i)(ii) ඡෙදය යටතට අදාළ මුදල් ඇණවුම් මේ හා අදාළ *ගැසට් නිවේදනය* පළකළ දින සිට මාස 3ක් ඇතුළත හෝ ඊට පෙර මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාළ නඩු අංක සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව දැන්විය යුතුය.

04. 1999.01.01 සිට 2000.12.31 වැනි දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම් සම්බන්ධයෙන් ඉහත II ඡේදය යටතේ මුදල ආපසු ගෙවීම ගැන මේ හා අදාළ *ගැසට් නිවේදනය* පළකළ දින සිට මාස 3ක් සම්පූර්ණ වන දිනය තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විදුලි මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා භාරගන්නා මුදල් ඇණවුම් සඳහා අදාළ වේ.

05. එබැවින් ඉහත 2 ඡේදය සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් අදාළ මුදල් ඇණවුම් ද සමග කොළඹ 01, ට්‍රාන්ස්වර්ක් මන්දිරයේ මුදල් ඇණවුම් සේවා පාලක වෙත *ගැසට් නිවේදනය* පළකල දින සිට මාස 03ක් ඇතුළත හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බව පළාත් සභා, පළාත් පාලන ආයතන, ගෙවල් කුලී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙත ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

06. තවද 1999.01.01 දින සිට 2000.12.31 දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන ලෙස පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම භාර නොගන්නා බවත්, මොනම හේතුවක් නිසා වුවද එවැනි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

07. 1998.12.31 දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත වුවද මුදල් ආපසු ගෙවනු නොලබන බව සලකන්න.

මහින්ද විජේසේකර,
තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය.

07-669

---

**වන්දනා ගමන් ආඥාපනත**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2009 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග ඓතිහාසික සිත්තම්ගල්ලෙන ඇසළ මහා පෙරහැර පූජෝත්සවයේ (වාර්ෂික උත්සව) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. *මේ නියෝගවල :—*

''කඳවුරු පෙදෙස'' යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

''දිස්ත්‍රික් ලේකම් / දිසාපති'' යන්නෙන් හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

''වෛද්‍ය නිලධරයා'' යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

''වන්දනාකරු '' යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

''පොලිස් නිලධරයා'' යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුළත් වේ. තවද,

''මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා'' යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඓතිහාසික සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථානයේ වාර්ෂිකව පැවැත්වෙන ඇසළ මහා පෙරහැර හා පූජෝත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියෙකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ

පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස් වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

එසේ වුවද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන්කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;

(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;

(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;

(ඈ) අසනීප වන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;

(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;

(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;

(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;

(ඌ) සේදීමේ හා ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;

(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල්, සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහා දැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැක.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවකදී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වා ගැනීම සඳහා කඳවුරු පෙදෙස තුළ, යම් වැවකට ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළ හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වෙනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අළුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2). යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අළුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කීරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අළුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අළුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුලු වනු ලැබීම ද එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියළු

දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිළියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇලක දොලක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැලිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීම විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදාදීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කරන දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක් රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධාරියා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත් වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම, එවැනි සියළු අපද්‍රව්‍ය කසල හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසල පොළවේ විසි කොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2 කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය හෝ ලෝහමය හෝ ප්ලාස්ටික් කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය හෝ ලෝහමය ප්ලාස්ටික් පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝග වල 16 වැනි, 17 වැනි 18 වැනි 19 වැනි නියෝග කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්,

එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට ඇත්තේය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නිත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති වරයා විසින් නියම කරනු ලැබීමද නිත්‍යානුකූල වන්නේය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ෂක රෝගයක් වැළ දී ඇති සෑම තැනැත්තෙක්මද එසේ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ෂක රෝගයක් වැළ දී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්මද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් පෙළෙන හෝ පෙලෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදාහැරීමේදී, විකිණීමේදී, හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගිවීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පළෙහි හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ෂක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගයන් යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්, දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වන නියෝගය හෝ 10 වන නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින් :-

(ඇ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ

(ඇ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නිත්‍යානුකූල වන්නේය.

30. *දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්:-*

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක් ;

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් ; සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යයි හෝ මහජන යහපත පිණිස වන්නේ යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වෙලාවක ඒ එසේ අවලංගු කිරීම නිත්‍යානුකූල වන්නේය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 559, වරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ ඓතිහාසික සිත්තම්ගල්ලෙන ඇසළ මහා පෙරහැර හා පූජෝත්සවය පැවැත්වෙන භූමි භාගය ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| *දකුණට* | : | වරාපිටිය කිරම මාර්ගයේ දෙමටකැටිය හන්දිය දක්වාද, වරාපිටිය - හදුගල මාර්ගයේ වැලිතුඩුව දක්වා ; |
| *නැගෙනහිරට* | : | වරාපිටිය - වැව මායිම දක්වා ; |
| *උතුරට* | : | වරාපිටිය - උඟුරුබොක්ක මාර්ගයේ රම්මල රෝහල දක්වා ; |
| *බස්නාහිරට* | : | වරාපිටිය මාවරල මාර්ගයේ විහාර මාවත දක්වාද සිත්තම්ගල්ලෙන රජමහා විහාරයේ ඉහළ විහාරය දක්වා. |

**පෙරහැර ගමන් ගන්නා මාර්ගය**

පෙරහැර දින 4 ක් වීථි සංචාරය කෙරේ. දින 3 ක් දේවාල පෙරහැරද 4 වැනි පෙරහැර ඇසළ මහා රන්දෝලි පෙරහැරද වේ.

සියලුම පෙරහැර සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථානයේ ඉහළ විහාරයෙන් ආරම්භ වී විහාර මාවත දිගේ පැමිණ වරාපිටිය, මාවරල පාරෙන් විහාරස්ථානයට පිවිසෙන මාර්ගයට පැමිණ සල්පිල් භූමිය හරහා ගොස් පලාබද්දල මාර්ගයෙන් නැවත වරාපිටිය මාර්ගයේ ගොස් වරාපිටිය හන්දියෙන් හැරී කිරම මාර්ගයේ ගොස් දේවාලය අසලින් ආපසු හැරී විහාරස්ථානය කරා ආපසු පැමිණේ.

07-733

**තොග ගනණ් ගැනීම හා වාර්ෂික හරි වැරදි බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ මධ්‍යම බෙහෙත් ගබඩාව වසා තැබීම**

වර්ෂ 2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා, (දෙදිනම ඇතුළත්ව) තොග ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා වසා තබනු ඇත

අත්‍යවශ්‍ය හදිසි ඖෂධ සහ අන්තරාදායක ඖෂධ හැර වෙනත් කිසිම ඖෂධයක් සඳහා එම කාල පරිච්ඡේදය තුළදී අයැදුම්පත් භාර නොගන්නා බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යෂකවරුන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ශික්ෂණ රෝහල් අධ්‍යකෂවරුන්, මහා රෝහල් අධ්‍යකෂකරුවන්, ගුවන්, නාවික, පාබල සහ පොලීසිය යන ආරක්ෂක අංශවල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානින් හා බෙහෙත් ශාලා භාර නිලධාරින් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය ඒ. එම්. එස්. වීරබණ්ඩාර,
වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ.

2009 ජූලි මස 08 වැනි දින,
අංක 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10,
වෛද සැපයීම් අංශයේ දී ය.

07-714

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 1239 හා 2003.12.17 දින දරන උකස්කරය මත සහ ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය, විසින් සහතික කරන ලද අංක 1388 හා 2006.10.19 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, සුසන්ත ජයලත් වේරගල මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 1239 හා 1388 දරන බැඳුම්කර මත රුපියල් දෙලක්ෂ අසූහතර දහස් හාරසිය අනූනවයක (රු. 2,84,499) මුදලක් සහ රුපියල් පහලොස් ලක්ෂයක (රු. 1,500,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දෙලක්ෂ අසූහතර දහස් හාරසිය අනූනවයක (රු. 2,84,499) එකී මුදල ද, 2008 මැයි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත, වර්ෂයකට සියයට දහහතයි දශම දෙකයි පහ (17.25%) බැගින් තවදුරටත් වූ පොලිය ද, 2008.08.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් පහලොස් ලක්ෂයක (රු. 1,500,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1239 හා 1388 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාරිනි සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උකස්කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, බත්තරමුල්ල-තලංගම උපනගර සභා සීමාව ඇතුළත කොට්ඨාස අංක 8 - දකුණු තලංගම වික්‍රමසිංහපුර පිහිටියා වූ ද සැන්ට් තෝමස් එස්ටේට් යයි කියනු ලබන ඉඩමේ වික්‍රමසිංහපුර පාරේ වරිපනම් අංක 718 දරන ඉඩමෙහි බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපුගීකියන විසින් සාදන ලද අංක 757 හා 1984 දෙසැම්බර් මස 16 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : වික්‍රමසිංහපුර පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු අනිල් පීරිස් විසින් සාදන ලද අංක 3298 හා 1983 සැප්තැම්බර් මස 28 වැනි දින දරන පිඹුරේ ලොට් අංක C දරන ආරියදාසගේ ඉඩම ද. බස්නාහිරට : පී. බී. එස්. කරුණාරත්නගේ සහ වික්‍රමාරච්චිගේ ඉඩම් ද මායිම්වන්නා වූ ද, පර්චස් හයක් (අ. 0, රූ. 0. පර්. 6) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, හා වෙනත් සියලු දේත් ය.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G. 1270/233 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කලාප II.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-688

---

## මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.05.26 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2006.03.22 දිනැති අංක 1116 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මාකාවිටගේ ලසන්ත සංජීව පෙරේරා මයා, වන්නිඅච්චිගේ එච්ජින් සිසිලින් ෆොන්සේකා මිය, යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හත්ලක්ෂ අනූඑක්දහස් දෙසීය අනූඑකක (රු. 7,91,291) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.10.24 වැනි දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් හත්ලක්ෂ අනූඑක්දහස් දෙසිය අනූඑකක (රු. 7,91,291) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ අනූඑක්දහස් දෙසිය අනූඑකක (රු. 7,91,291) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් එකී අංක 1116 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරයි.

### උකස්කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, බත්තරමුල්ල ලංගම උප ඒකකය තුළ බත්තරමුල්ලේ පිහිටි "මකුලුගහවත්ත" නම් වූ ඉඩමට බලයලත් මානක එස්. ආර්. ඒ. ජයසිංහ මහතා විසින් 1994 මැයි මස 18 වැනි දින මැන සකස් කළ අංක 902 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 5බී දරන කොටසට මායිම්, උතුරට : අඩි 15ක් පළල පාර ද, නැගෙනහිරට : අඩි 15ක් පළල පාර ද, දකුණට : මෙම ඉඩමේම කොටසක් වූ ලොට් අංක 6 දරන කැබැල්ල ද, බස්නාහිරට : ලොට් අංක 5ඒ දරන කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 12.56) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ ගහකොළ, පළතුරු ආදී සියළු දේද වේ.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 977/293 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කලාප II.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-689

---

## මහජන බැංකුව - කිරුළපන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. නන්දනී පෙරේරා මහත්මිය විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2006.11.01 දිනැති අංක 3868 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ, ලොරිස් පාරේ, අංක 70 ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන්නාවූ, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන සීමාසහිත ස්විචස් (පෞද්ගලික) සමාගම සහ ශාන්ති විනෝදන්–විවාහයට පෙර කදිරවේම්පිල්ලෙයි සහ සරණවතී කදිරවෙම්පිල්ලෙයි යන අය විසිස් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3868 දරන උකස්කරය මත රුපියල් පනස්ලක්ෂයක (රු. 50,00,000) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2008.10.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් රුපියල් පනස්ලක්ෂයක (රු. 50,00,000) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් පනස්ලක්ෂයක (රු. 50,00,000) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3868 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ කාසල් පටුමගෙහි වරිපනම්

අංක 19/1A දරන බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් 1986 මැයි මස 23 වැනි දින සාදන ලද අංක 1577 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත පළමු මහලේ පිහිටි තට්ටු නිවාසයේ (දෙවන මහළ) ඒකක 2 ලොට් 2 වශයෙන් විස්තර කරනු ලබන පරිශ්‍රයට මායිම්, උතුරට : මෙම කොටසේ උතුරු බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම කොටසේ නැගෙනහිර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම කොටසේ දකුණු බිත්තියේ මධ්‍යය සහ බටහිරට : මෙම කොටසේ බටහිර බිත්තියේ මධ්‍යය ද, මුදුනට : මෙම කොටසේ වහලයේ මධ්‍යය ද, පාපසට : මෙම කොටසේ බිමෙහි මධ්‍යය ද යන මෙකී මායිම් තුළ පිහිටි වර්ග අඩි එක්දහස් පන්සිය අසූපහක් (වර්ග අඩි 1585) විශාල බිම් ප්‍රමාණය. මෙම සහාධිපත්‍ය ඒකකය සහ කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහාධිපත්‍ය A30/283 යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 42 ඡන්ද කොට්ඨාසයේ (හැව්ලොක් නගරය) පිහිටා ඇති සහාධිපත්‍ය දේපළ තුළ සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ සිට ගොඩනැගිල්ල පිටතට බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් 1986 මැයි 23 වැනි දින මැන සාදන ලද අංක 1577 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත "ඒ" වශයෙන් ලකුණු කර ඇති ඒකක 2 ලොට් 3 ඇතුල්වීම සහ තරප්පුව වශයෙන් විස්තර කරනු ලබන පරිශ්‍රයට මායිම්, උතුරට : මෙම කොටස වෙන් කරන මෙම කොටසේ උතුරු බිත්තියෙහි මධ්‍යය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම කොටස වෙන් කරන මෙම කොටසේ නැගෙනහිර බිත්තියෙහි මධ්‍යය සහ ඒකක 1 - ලොට් 1 ද, දකුණට : මෙම කොටස වෙන් කරන මෙම කොටසේ දකුණු බිත්තියෙහි මධ්‍ය සහ ඒකක 1 ලොට් 1 ද, බටහිරට : මෙම කොටස වෙන් කරන මෙම කොටසේ බටහිර බිත්තියේ මධ්‍යය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මුදුනට : ඒකක 2 ලොට් 2හි බිමෙහි මධ්‍යය ද, පාපසට මෙම කොටසේ බිමෙහි මධ්‍යය ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 1577 දරන පිඹුරට ප්‍රකාර වර්ග අඩි 115ක් විශාල බිම් ප්‍රමාණය

*පොදු අංගෝපාංග*

1982 අංක 45 දරන පනතේ 12 වැනි වගන්තිය මගින් (සංශෝධන) සංශෝධිත 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් නීතියෙහි 26 වැනි වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත පොදු අංගෝපාංග

1. (අ) ගොඩනැගිල්ල පිහිටි භූමිය
   (ආ) එම ඉඩමේ ඉතිරි කොටස

2. අත්තිවාරම්, මහාබාල්ක, බාල්ක, රුකුල්, ජලනළ, අපද්‍රව්‍ය වහනය වන කානු, මැන්හෝල්, ප්‍රධාන ස්විච්වල සිට මීටර් සහ වහලය දක්වා වූ විදුලි රැහැන්

3. ඉහත විස්තර කරනු ලබන තට්ටු නිවාස මගින් ආවරණය කරනු ලබන ප්‍රදේශ හැර ගොඩනැගිල්ලේ අනෙකුත් සියලුම ඉදිකිරීම්

4. තරප්පු, තරප්පු පේළි, ගොඩනැගිලිවලට ප්‍රවේශ මාර්ගය සහ පිටවීමේ මාර්ග.

අංක 42 ඡන්ද කොට්ඨාසයේ (හැව්ලොක් නගරය) කාසල් වීදියේ (දෙවන මහළ) අංක 19/1A වරිපනම් අංකය දරන තට්ටු නිවාසයේ පළමු මහලේ ඒකක 2- ලොට් 2ට යාබදව පොදු අංගෝපාංග හවුලේ පරිහරණය කිරීම, නොබෙදු 56.2% (සියයට පනස්හයයි දශම දෙකක්)

පහත විස්තර කරනු ලබන පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස මතින් සහ දිගේ ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ බම්බලපිටියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. කුමාරස්වාමි මහතා විසින් 1971 අගෝස්තු මස 31 වැනි දින මැන සාදන ලද අංක 800B දරන එකී මිණුම් පිඹුරේ නිරූපිත "ලොට් 6" දරන (මාර්ගයක් සඳහා වෙන් කර ඇති) ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, (මෙම ඉඩමේ කොටසක් සහ කාසල් පටුමග විථිරේඛාවෙන් ආවරණය වී ඇති) නැගෙනහිරට : ලොට් 5 සහ 14 ද, දකුණට : ලොට් 13 සහ 14 ද, බටහිරට : ලොට් 7 සහ 13 ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 800B දරන පිඹුර ප්‍රකාර පර්චස් තුනයි දශම හතරයි හයක් (අ. 0, රූ. 0, පර්. 3.46) විශාල ඉඩම. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A527/258 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

07-687

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 25/0/33/00131.

ණයකරුගේ සම්පූර්ණ නම : වික්‍රම ආරච්චිලාගේ පියසේන වික්‍රමආරච්චි.

රඹුක්කන ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ඩී. එන්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 1533 හා 1996.04.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් :

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පහළොස්දහස් අටසිය හැටහයයි ශත දහනවයක (රු. 1,15,866.19) මුදලක් වර්ෂ 2003.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූදෙදහස් හත්සිය එකොළහයි ශත හැත්තෑනවයක (රු. 92,711.79) මුදල ද වර්ෂ 2003.03.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිතුන්දහස් එකසිය පනස්හතරයි ශත හතලිස්හතරක් (රු. 23,154.44) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පහළොස්දහස් අටසිය හැටහයයි ශත දහනවයක් (රු. 1,15,866.19) ද,

(2) එකී රුපියල් අනූදෙදහස් හත්සිය එකොලහයි ශත හැත්තෑනවයක (රු. 92,711.79) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2003.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ඕතර පත්තුවේ, බෙලිගල් කෝරළේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ මංගෙදර පිහිටි හිටිනාවත්ත නමැති ඉඩමට 1995.02.06 දින ඒ. සී. පී. ගුණසේන මානක තැන විසින් මැන සැකසූ අංක 866 දරන පිඹුර ප්‍රකාර කැබැලි අංක 01 දරන කොටසේ, උතුරට : මැදිලන්දවත්ත ද, නැගෙනහිරට : කැබැලි අංක 02 ද, දකුණට : මෙම ඉඩමේ කොටසක් වන කැබැලි අංක 3 සහ බස්නාහිරට : ප්‍රධාන මාර්ගය දක්වා දිවෙන ගම්සභා පාර සහ පැල වැට සහ කම්බි වැට ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිපහයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 25.62) විශාල ඉඩම ද වේ. මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 1012/76හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

සාමාන්‍යාධිකාරී.

07-711

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500001637.

ණයකරුගේ සම්පූර්ණ නම : හේවා පේඩිගේ අනුර කරුණාරත්න.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් යූ. අයි. හෙට්ටිආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 107 හා 2004.10.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් :

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටඅට දහස් පන්සිය හැත්තෑ නවයයි ශත තිස් හතක (රු. 2,68,579.37) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ තිස්නවදහස් දෙසිය පනහයි ශත පනස් දෙකක (රු. 2,39,250.52) මුදල ද වර්ෂ 2008.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිනව දහස් තුන්සිය විසිඅටයි ශත අසූ පහක් (රු. 29,328.85) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හැටඅට දහස් පන්සිය හැත්තෑ නවයයි ශත තිස් හතක (රු. 2,68,579.37) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ තිස්නවදහස් දෙසිය පනහයි ශත පනස් දෙකක (රු. 2,39,250.52) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් හා පාතබුලත්ගම් කෝරළේ, එරබදුවල ග්‍රාමයෙහි පුස්සහේන නමැති ඉඩමට 1963 මැයි සහ 1964 ජනවාරි, 2004.03.18 වැනි දින මිනුම්පති විසින් මැන සම්පාදිත අංක මු. පි. කෑ. 23 පිඹුර ප්‍රකාර කැබැලි අංක 33ට උතුරට : කැබැලි අංක 27 ද, නැගෙනහිරට : කැබැලි අංක 49 දරන පාර ද, දකුණට : කැබලි අංක 39 ද, බටහිරට : කැබැලි අංක 19 දරන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි දෙකක (අ. 0, රූ. 1, පර්. 22) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද් මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉ සං ආර් 8/16හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

සාමාන්‍යාධිකාරී.

07-712

**සම්පත් බැංකුව පී. එල්. සී.**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0090 5000 0815.

සීමාසහිත සම්පත් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ ජූලි මස 24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සම්පත් බැංකුව පීඑල්සී යනුවෙන් දැන් හඳුන්වනු ලබන (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත) සීමාසහිත සම්පත් බැංකුව නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මාර්තු මස 19 දාතම හා අංක 1208 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දඹුල්ල, මොරගොල්ලෑව, සක්විති උයන, අංක 36හි දැනට පදිංචි හා මොරගල්ලෑව, සක්විති උයන, අංක 36හි පදිංචි යද්දෙහිගේ අනිල් චන්දික බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දොලොස් ලක්ෂ අනූ දෙදහස් එකසිය අසූ පහයි ශත අසූ එකක (රු. 12,92,185.81) මුදලක් 2008 අප්‍රේල් මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දොලොස් ලක්ෂ අනූ දෙදහස් එකසිය අසූ පහයි ශත අසූ එකක (රු. 1,292,185.81)ක මුදල ද, 2008 අප්‍රේල් මස 12 වැනි දින සිට අංක 1208 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම ලක්ෂ අසූහතර දහස් පන්සිය හැට හතරයි ශත අසූ දෙකක (රු. 9,84,564.82) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1208 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ලේකම් කොට්ඨාසය තුළ වගපනහ පල්ලේසිය පත්තුව තිත්තවැල්ගොල්ල නොහොත් දඹුලුඔය ග්‍රාමයේ පිහිටි පටහයාය, තනහේන්යාය, ඇතිනි වැටිච්ච යාය සහ දියපල්ලන් යාය දැන් එක් ඉඩමක් වශයෙන් “දඹුලුඔය එස්ටේට්” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 2003 මාර්තු මස 15 වැනි දාතම හා අංක 1698 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන ශ්‍රී බෝපේ ආරච්චි විසින් සාදන ලද අංක 1835 දරන පිඹුරේ ලොට් 101 (අඩි 20 පළල පාර), නැගෙනහිරට : අංක 1835 දරන එකී පිඹුරේ ලොට් 35, දකුණට : අංක 1835 දරන එකී පිඹුරේ ලොට් 67, බස්නාහිරට : අංක 1835 දරන එකී පිඹුරේ ලොට් 37 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1698 ට අනුව ය.

එකී ලොට් 1, පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී තිත්තවැල්ගොල්ල නොහොත් දඹුලුඔය ග්‍රාමයේ පිහිටි පටහයාය, තනහේන්යාය, ඇතිනි වැටිච්ච යාය සහ දියපල්ලන් යාය දැන් එක් ඉඩමක් වශයෙන් “දඹුලුඔය එස්ටේට්” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සිරිබෝපේ ආරච්චි විසින් සාදන ලද 1995 ජූලි මස 07 දාතම හා අංක 1835 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 36 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 101 (මීටර් 6 පළල පාර), නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 35, දකුණට : එම පිඹුරේ ලොට් 67, බස්නාහිරට : එම පිඹුරේ ලොට් 37 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1835ට අනුව වෙළුම/පිටුව ඩී 477/117 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහතින් සවිස්තරව විස්තරකොට ඇති පරිදි එකී අංක 1835 පිඹුරේ නිරූපිත ලොට් 100 සහ 101 වශයෙන් ලකුණු කොට ඇති මාර්ගය (මීටර් 6 පළල) මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද සමග ය.

එකී තිත්තවැල්ගොල්ල නොහොත් දඹුලුඔය ග්‍රාමයේ පිහිටි පටහයාය, තනහේන්යාය, ඇතිති වැටිච්ච යාය සහ දියපල්ලෙන් යාය දැන් එක් ඉඩමක් වශයෙන් “දඹුලුඔය එස්ටේට්” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සිරි බෝපේ ආරච්චි විසින් සාදන ලද 1995 ජූලි මස 07 දාතම හා අංක 1835 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 100 සහ 101 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 1 සිට 23 සහ ලොට් 26, නැගෙනහිරට : දඹුල්ල සිට මාතලේ දක්වා ප්‍රධාන පාර සහ ලොට් 1, දකුණට : එකී පිඹුරේ ලොට් 32 සිට 51 දක්වා සහ ලොට් 27 සහ බස්නාහිරට : අංක 1800 එකී පිඹුරේ ලොට් 2 (මීටර් 9 පළල මාර්ගය) වෙළුම/පිටුව ඩී 477/118හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/4

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුනු)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0008 5002 3840.

2007 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුව පි. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්තල, හේකිත්ත, සෙබස්තියන් පාරේ, අංක 54හි සුප්පයියා යෝගරාජා යන අය බන්ධන්දායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 ජූලි මස 16 දාතම හා අංක 2827 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබ ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූලි මස 18 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ දහසය දහස් හත්සිය තිස් අටකුත් ශත හැත්තෑ තුනක් (රු. 4,16,738.73 පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිගව ඇති හෙයින් එකී රුපියල් හාරලක්ෂ දහසය දහස් හත්සිය තිස් අටකුත් ශත හැත්තෑ තුනක් (රු. 4,16,738.73 පමණයි) සම්පූර්ණ මුදල් සමග තවත් රුපියල් තුන්ලක්ෂ පනස්හත් දහස් එකසිය අනූ නවයකුත් ශත අනූපහක (රු. 3,57,199.95ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2007 ජූලි මස 19 වැනි දින සිට එකී අංක 2827 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමාකරන දින තෙක් තවදුරටත් පොලිය ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2827 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම්පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ හැදල උපකාර්යාල සීමාව තුළ හේකිත්තේ පිහිටි "ගොරකගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමෙන් (බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 1995 මැයි මස 12 දාතම හා අංක 2844 දරන පිඹුරේ ලොට් 1හි ප්‍රති මිනුම් හා උපබෙදුමක් වන) බලයලත් මිනින්දෝරු ඞී. ඞී. සී. ඒ. පෙරේරා විසින් මැන සාදන ලද 2003 නොවැම්බර් මස 24 දාතම හා අංක 2732 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම්/පත්ඉරුව බී 876/269 යටතේ ලියාපදිංචි කර ඇති එකී අංක 2732 පිඹුරට අනුව උතුරට : පී. ඩබ්. සිල්වාගේ සහ එස්. තිලකරත්නගේ ඉඩම ද, නැගෙනහිරට : කලින් පී. ආර්. පීරිස්ගේ ඉඩම ද, දකුණට : එකී අංක 2732 පිඹුරේ (අඩි 10 පළල පාරට වෙන්කළ කොටස) ලොට් 5 ද සහ බටහිරට : ආර්. එම්. එල්. පෙරේරාගේ ඉඩම ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග

පහත සඳහන් බිම් කොටස් මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, හැදල සුළු නගර සභා සිමාව තුළ හේකිත්තේ පිහිටි ගොරකගහවත්ත සහ කහටගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1995 මැයි මස 12 දාතම හා අංක 2844 දරන පිඹුරේ ලොට් 5 (අඩි 10 පළල පාරට වෙන්කළ කොටස) ලෙස ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව බී 876/288 යටතේ ලියාපදිංචි කළ එකී අංක 2844 පිඹුරට අනුව උතුරට : මෙහිම ලොට් 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද සහ බටහිරට : ලොට් 3, 4 සහ 2 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) වන බෙදා වෙන්කළ කොටස

2. ඉහත කී හේකිත්තේ පිහිටි ගොරගහවත්ත සහ කහටගහවත්ත නමැති ඉඩමෙන් සාදන ලද ඉහත කී 2003 නොවැම්බර් මස 24 දාතම හා අංක 2732 පිඹුරේ ලොට් 5 (අඩි 10 පළල පාරට වෙන්කළ කොටස) ලෙස ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව බී 876/288 යටතේ ලියාපදිංචි කර ඇති එකී අංක 2732 පිඹුරට අනුව උතුරට : මෙහිම ලොට් 1 ද, නැගෙනහිරට : කලින් පී. ආර්. පීරිස්ගේ ඉඩම හා පාර ද, දකුණට : අංක 2844 පිඹුරේ ලොට් 5 (අඩි 10ක් පළල පාරට වෙන්කළ කොටස ද) සහ බටහිරට : මෙහිම ලොට් 2, 3 සහ 4 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 3.55) වන බෙදා වෙන් කළ කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/5

---

## සම්පත් බැංකුව පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0035 5001 6752.

2008 ජනවාරි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇල්පිටිය, උසාවිය පාරේ, "වීරකැලුම්" හි පදිංචි ලලනි පොන්නම්පෙරුම සහ ගාමිණී පද්මානන්ද වීරක්කොඩි යන දෙදෙන බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී ඇල්පිටිය, උසාවිය පාරේ, "වීරකැලුම්" හි එකී ගාමිණී පද්මානන්ද වීරක්කොඩි යන අය උකස්කරු වශයෙන්, මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඞී. හේවාවිතාරණ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 දෙසැම්බර් මස 20 දාතම හා අංක 245 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 නොවැම්බර් මස 07 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ විසිඑක් දහස් පන්සිය තිස් හතරකුත් ශත විසිහයක (රු. 11,21,534.26) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති බැවින් එකී රුපියල් එකොලොස් ලක්ෂ විසි එක් දහස් පන්සිය තිස්හතරකුත් ශත විසිහයක (රු. 11,21,534.26) සම්පූර්ණ හිඟ මුදල සමග, රුපියල් තුන්ලක්ෂ දාහත් දහසක (රු. 3,17,000) මුදල සඳහා වසරකට සියයට දොලහ (12%) බැගින් ද, තවත් රුපියල් පන්ලක්ෂ අනූනව දහස් හයසිය හැත්තෑ නවයකුත් ශත හැටක (රු. 5,99,679.60)ක මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2005 නොවැම්බර් මස 08 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 245 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු

අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, නැගෙනහිර වල්අඹගල පිහිටි දීයවිටිකන්ද නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. පතිරණ විසින් සාදන ලද අංක 2001 ජූනි මස 13 දාතම හා අංක 3054 දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට නිරූපිත බලපිටිය ඉඩම් කාර්යාලයේ L. D. O. W. 1/455හි ලියාපදිංචි කොට ඇති, උතුරට : කලින් ලොට් 212 L. D. O. (ලොට් අංක) බෙදා වෙන් කළ කොටස් ලොට් 306 සහ 354, අඩි 20 මාර්ග, 310, 321, 322 සහ 334 (එම ඉඩමේම නව ලොට් අංක) ද, නැගෙනහිරට : එම ඉඩමේම කලින් 212, නව ලොට් අංක 354, 322, 334, 422 සහ 419 ද, දකුණට : එම ඉඩමේ ලොට් 209, 210 සහ 417 ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 385, 386, 377, 381, 209 සහ 210 ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දහනවයයි රූඩ් තුනයි පර්චස් තිස්තුනක් (අ. 19, රූ. 3, පර්. 33) (හෙක්. 8.076) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/6

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1082 5308 3344.

2007 දෙසැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය, ලියනගොඩ, අංක 1032/5/ඒ හි පදිංචි හේවා කටුවන්දෙනියගේ ජානක යන අය බන්ධන්දායින් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 මාර්තු මස 06 දාතම හා අංක 2734 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූලි මස 12 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දසලක්ෂ පනස්පන්දහස් දෙසීය අසූ පහකුත් ශත අසූහයක (රු. 10,55,285.86ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දසලක්ෂ පනස්පන්දහස් දෙසීය අසූ පහකුත් ශත අසූහයක (රු. 10,55,285.86ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් නවලක්ෂ හැට එක් දහස් පන්සිය හැත්තෑ දෙකකුත් ශත හතලිස් දෙකක (රු. 9,61,572.42ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2007 ජූලි මස 13 වැනි දින සිට එකී අංක 2734 බැඳුම්කරය මත අයවිය යුතු සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකර අයකර ගැනීම සඳහා.

මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 2734 බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ මහර සූරියපාලුව පිහිටි "දවටගහවත්ත දවටගහකුන්දුවත්ත (දවට ගහ කුරුඳුවත්ත) නොහොත් සූරිගම්පරනවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. එම්. එෆ්. එස්. විරසිංහ විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 02 දාතම හා අංක 2778 දරන පිඹුරේ ලොට් 11 ලෙස ලකුණු කොට නිරූපිත, උතුරට : ලොට් 10 ද, නැගෙනහිරට : ලොට් 13 හා ලොට් 09 ද, දකුණට : ලොට් 12 ද සහ බටහිරට : පී. ඩබ්ලිව්. ඩී. පාර ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග.

එකී ලොට් 11 පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිනුමකි.

ඉහත කී මාතර, සූරියපාලුව පිහිටි "දවටගහවත්ත දවට ගහ කුරුඳුවත්ත නොහොත් සූරිගම්පරනවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1972 මාර්තු මස 10 දාතම හා අංක 1008 දරන පිඹුරේ ලොට් 11 ලෙස ලකුණු කොට නිරූපිත ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව C768/125හි ලියාපදිංචි කොට ඇති, උතුරට : ලොට් 10 ද, නැගෙනහිරට : ලොට් 12 සහ ලොට් 09 ද, දකුණට : ලොට් 12 ද සහ බටහිරට : පී. ඩබ්ලිව්. ඩී. පාර ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග සහ

පහත දැක්වෙන ඉඩම් කට්ටි මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

ගම්පහ ඉඩම් කාර්යාලයේ C507/100හි ලියාපදිංචි කොට ඇති අංක 1008 පිඹුරේ නිරූපිත ලොට් R1 (පාරට වෙන්කළ කොටස) ගම්පහ ඉඩම් කාර්යාලයේ C4344/272හි ලියාපදිංචි කොට ඇති අංක 1008 පිඹුරේ ලොට් R6 (පාරට වෙන්කළ කොටස)

ගම්පහ ඉඩම් කාර්යාලයේ C507/1181හි ලියාපදිංචි කොට ඇති ලොට් R10 (පාරට වෙන් කළ කොටස)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/3

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1069 5313 9861.

2007 නොවැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම මහකටුවන අංක 544හි පදිංචි රම්‍යා කීර්තිලතා අබේගුණවර්ධන යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනරි විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජුනි මස 14 දාතම හා අංක 1149 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මැයි මස 09 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ දහතුන් දහස් හයසිය පනස් එකකුත් ශත දොලහක් (රු. 8,13,651.12ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ දහතුන් දහස් හයසිය පනස් එකකුත් ශත දොලහක් (රු. 8,13,651.12ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හත් ලක්ෂ අසූහයදහස් හයසිය එකකුත් ශත දහඅටක (රු. 7,86,601.18ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2007 මැයි මස 10 වැනි දින සිට විකුණුම් දින එකී අංක 1149 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිගව ඇති සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1149 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම ගමේ පිහිටි කහටගහලන්ද නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 2003 සැප්තැම්බර් මස 27 දාතම හා අංක 2380 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G1492/240හි ලියාපදිංචි කළ එකී අංක 2380 පිඹුරට අනුව, උතුරට : දූවවත්ත පාර ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : මර්තේලිස් අප්පුහාමි අයිතිය කියන ලොට් ඒ ද සහ බටහිරට : ලොට් A3A ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.10) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/2

---

### සම්පත් බැංකුව පී. එල්. සී.
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුනු)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0069 5000 0285.

2007 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම හයිලෙවල් පාර්, අංක 42/1 ශාන්ති නිවසේ පදිංචි අරංගලගේ දොන් ප්‍රේමචන්ද්‍ර යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. ජී. සුනරි විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජූලි මස 26 දාතම හා අංක 1235 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජුනි මස 27 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නවලක්ෂ පනස්හතර දහස් අටසිය අසූදෙකකුත් ශත හතලිස් හතරක් (රු. 9,54,882.44ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් නව ලක්ෂ පනස්හතර දහස් අටසිය අසූදෙකකුත් ශත හතලිස් හතරක් (රු. 9,54,882.44ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් අටලක්ෂ අනූනවදහස් අටසියයක (රු. 8,99,800ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහඅට (18%) බැගින් 2007 ජුනි මස 28 වැනි දින සිට විකුණුම් දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග එකී අංක 1235 උකස් බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දින තෙක් පොළී මුදල ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකර අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 1235 බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහපත්තුවේ, එස්වත්තේ පිහිටි දියපොතකැලේ නමැති ඉඩමෙන්

බලයලත් මිනින්දෝරු යූ. එල්. එන්. ටී. චන්දන විසින් සාදන ලද 1997 ඔක්තෝබර් මස 12 දාතම හා අංක 1311 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති අවිස්සාවෙල්ල ඉඩම් කාර්යාලයේ P104/163හි ලියාපදිංචි කර ඇති එකී අංක 1311 පිඹුර ප්‍රකාර උතුරට : කේ. ඒ. අංගොනෝනා සහ තවත් අය අයිතිය කියන ඉඩම සහ කේ. වෙත්තසිංහ අයිතිය කියන ඉඩම ද, නැගෙනහිරට : කේ. වෙත්තසිංහ අයිතිය කියන ඉඩම සහ ඩී. බී. වැලිකල අයිතිය කියන ඉඩම ද, දකුණට : පෞද්ගලික පාර ද සහ බටහිරට : ලොට් 2 සහ කේ. ඒ. අන්ගොනෝනා අයිතිය කියන ඉඩම ද, මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් තුනයි පර්චස් විසිහතක් (අ. 1, රූ. 3, පර්. 27) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියලු අයිතීන්, මාර්ග වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුවරඑළිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.05.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.09.02 දින සහ අංක 729 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම හත්තොටුව ගමගේ පසන් හිමාලක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ අනූඑක්දහස් දෙකයි ශත තිස්තුන (රු. 7,91,002.33) ක මුදලක් 2009.02.29 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 7,91,002.33ක මුදලට 2009.03.01 වැනි දින විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 729 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ කොට්ඨාසයේ, දිඹුල කෝරළේ, තලවකැලේ ලිඳුල, නාගරික සීමාවේ, ලිදුල ගමේ, නුවරඑළිය පාරේ, වරිපනම් අංක 537 ඉඩමට බලයලත් මානක ඩබ්. එම්. පෙරේරා විසින් 1962.07.15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 467හි ලොට් අංක 6බී නමැති ඉඩමේ උතුරට : බෙල්ග්‍රෙවියා එස්ටේට් ද, නැගෙනහිරට : පිඹුරු අංක 467 ලොට් අංක 7න් ද, නිරිතදිගට : ප්‍රධාන පාරෙන් ද සහ වයඹට : පිඹුරු අංක 467හි ලොට් අංක 6ඒ වලින් මායිම් වූ පර්චස් එකයි දශම නමයයි එක (අ. 0, රූ. 0, පර්. 1.91)ක් විශාලත්වය ඇති මෙම ඉඩම ගොඩනැගිලි සහ සියළුදේත් සමග නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 188/96 වෙළුමේ/පත්‍රුරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ලොට් අංක 6බී දරන ඉහත ඉඩම නැවත මැනීමකට අනුව :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ කොට්ඨාසයේ දිඹුල කෝරළේ, තලවාකැලේ ලිඳුල, නාගරික සීමාවේ, ලිඳුල ගමේ, නුවරඑළිය පාරේ, වරිපනම් අංක 537 ඉඩමට බලයලත් මානක එච්. එම්. සමරනායක විසින් 2003.01.23 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 370බීහි ලොට් අංක 1 නමැති ඉඩමෙහි උතුරට : බෙල්ග්‍රේවියා එස්ටේට් සහ පිඹුරු අංක 467හි නැවත මනින ලද ලොට් අංක 6 කොටසින් සහ ප්‍රධාන පාරෙන් ද, නැගෙනහිරට : බෙල්ග්‍රේවියා එස්ටේට සහ පිඹුරු අංක 467හි ලොට් අංක 7න් ද, දකුණට : ප්‍රධාන පාරෙන් සහ පිඹුරු අංක 467හි ලොට් අංක 7න් ද සහ බටහිරට : ප්‍රධාන පාරෙන් සහ පිඹුරු අංක 467හි ලොට් 6ඒ වලින් ද, මායිම් වූ පර්චස් එකයි දශම නමයයි එක (අ. 0, රූ. 0, පර්. 1.91) ක් විශාලත්වය ඇති මෙම ඉඩම ගොඩෙනැගිලි සහ සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-723/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බදුල්ල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.05.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2007.01.01 දින සහ අංක 447 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කාසිගේ දමින්ද ද සිල්වා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් හැත්තෑහතර ලක්ෂ විසිහතරදහස් එකසිය තුනයි ශත හැත්තෑහත (රු. 74,24,103.77) ක මුදලක් 2008.10.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 74,24,103.77ක මුදලට 2008.10.31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු

සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 447 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ ධර්මදූත පාරෙහි පිහිටි වරිපනම් අංක 18, ඞී/18/1, ඞී/18/1/1 සහ ඞී/18/1/2 දරන "වරකාවේවත්ත හෙවත් වරකාවේ-අගත" "කිංග්ස් තියටර් සහ ප්‍රමිසස්" නමැති ඉඩමට බලයලත් මානක එම්. එෆ්. එෆ්. ඉස්මයිල් විසින් මැන සාදන ලද 2006.11.22 දිනැති අංක 1390 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : සිමෙන්තියෙන් බඳින ලද කාණුවකින් වෙන් කරන ලද ධර්මදූත පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 2න් ද, දකුණට : ලොට් 3න් ද සහ බස්නාහිරට : බදුල්ල ධර්මදූත පාසලෙන් ද, සහ සිමෙන්තියෙන් බඳින ලද කාණුවකින් වෙන් කරන ලද පරිශ්‍රයෙන් ද මායිම් වූ එකී අංක 1390 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටයි දශම හතයි පහ (රූ. 0, රූ. 0. පර්. 18.75) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 90/248 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-723/2

---

## සම්පත් බැංකුව පී. එල්. සී.
## (කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුනු)

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1029 5331 5433.

2008 ජූලි මස 24 වැනි දින සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතම හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රනරජයේ මාලබේ සුසිලාරාම පරේ, අංක 502/3හි ශිරෝම චාන්දනී සෙනරත් දසනායක, හසහ රොෂාන් අජන්ත සෙනරත් දසනායක යන දෙදෙන බන්ධන්දයින් වශයෙන් සහ ඉහත කී මාලබේ සුසිලාරාම පාරේ, අංක 502/3හි එකී ශිරෝමා චාන්දනී සෙනරත් දසනායක යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. අයි. උදයාංගනී විසින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කල සමාගම් අංක PQ144 දරන දැන් සම්පත් බැංකුව පීඑල්සී නමින් හැඳින්වෙන සීමාසහිත සම්පතව් බැංකුව නමට ලියා සහතික කළ 2007 සැප්තැම්බර් මස 28 දාතම හා අංක 175 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරනල ද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 පෙබරවාරි මස 11 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් හත්ලක්ෂ තිස් අට දහස් දෙසිය තිස් එකකුත් ශත හතක (රු. 47,38,231.07ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී හතලිස් හත් ලක්ෂ තිස්අට දහස් දෙසිය තිස් එකකුත් ශත හතක (රු. 47,38,231.07ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් හතලිස් හතර ලක්ෂ හැට දහසක (රු. 44,60,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින් 2008 පෙබරවාරි මස 12 වැනි දින සිට එකී අංක 175 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමාකරන දින තෙක් තවදුරටත් පොළිය ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 175 දරන බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පාළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලබේ පිහිටි ජුවමලගේවත්ත නොහොත් හිග්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි විසින් මැන සාදන ලද 1988 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 2215 දරන පිඹුරේ අංක 10 ලෙස ලකුණු කොට නිරූපිත ඊසානට : සුසිලාරාම පාර ද, ගිණිකොණට : අංක 1173 පිඹුරේ නිරූපිත ලොට් 9 ද, නිරිතට : එකී අංක 1173 පිඹුරේ ලොට් 4 ද, සහ වයඹට : අංක 1173 පිඹුරේ ලොට් 11 (අඩි 15 පළල පාර) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම පහක් (පර්. 17.5) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

එකී ඉඩම පහත දැක්වෙන ඉඩමේ ප්‍රති මිනුමකි.

ඉහත කී මාලබේ පිහිටි ජුවමලගේවත්ත නොහොත් හිග්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩී, සිරිසේන විසින් මැන සාදන ලද 1968 අගෝස්තු මස 08 දාතම හා අංක 1173 දර පිඹුරේ ලොට් 10 ලෙස ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 1418/227 එකී අංක 1173 පිඹුරට අනුව උතුරට : ලොට් 11 ද සහ නැගෙනහිරට : සුසිලාරාම පාර ද, දකුණට : ලොට් 09 සහ බටහිරට : ලොට් 04 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 17.5) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග

පහත දැක්වෙන ඉඩම මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

ඉහත කී මාලබේ පිහිටි ජුවමලගේවත්ත නොහොත් හික්ගහවත්ත නමැති ඉඩමේ එකී අංක 1173 පිඹුරේ නිරූපිත ලොට් 11 ලෙස ලකුණු

කොට දක්වා ඇති හෝමාගම ඉඩම් කාර්යාලයේ ජී 1418/228 යටතේ ලියාපදිංචි කළ එකී අංක 1173 පිඹුරට අනුව පර්චස් හයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 6.3) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස ය.

පහත දැක්වෙන ඉඩම මතින් යටින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-734/8

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**

(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුනු)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0040 1000 3224.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතම හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සම්පත් බැංකුව පීඑල්සී (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජූලි මස 12 වැනි දින හා අංක 666 උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ කොළඹ 15, බ්ලූමැන්ඩල් පාර, අංක 793හි ලියාපදිංචි කාර්යාලය සහිතව දැනට එම ජනරජයේ කොළඹ 05, නාවල පාර, අංක 129/1 හි පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය අනුව නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ජේ. කේ. ආර්. විදුරංග හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක්කෝටි පනස් අට ලක්ෂ විසිහය දහස් හත්සිය විස්සක් හා ශත හයක (රු. 1,58,26,720.06) මුදලක් 2008 ජුනි මස 30 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි පනස් අටලක්ෂ විසිහය දහස් හත්සිය විස්සක් හා ශත හයක (රු. 1,58,26,720.06) මුදල ද 2008 ජූලි මස 01 වැනි දා සිට අංක 666 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හතලිස් තුන් ලක්ෂ හැත්තෑ හතර දහසක (රු. 1,43,74,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 666 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ නාරාහේන්පිට පිහිටි නාරාහේන්පිට පාරේ, වරිපනම් අංක 129/1 දරන "පිල්ලෑව කුඹුර ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කන්නන්ගර විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 20 දාතම හා අංක 796/2005 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 7 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කජුගහ ඕවිට, රජයේ කිරිපට්ටි ගොවිපල, නැගෙනහිරට : ගන්ජිම්මා ඕවිට, රජයේ කිරිපට්ටි ගොවිපල, දකුණට : රණතුංගගේ වත්ත සහ අංක 255 පිඹුරේ ලොට් 8 (අඩි 20 පළල පාර) සහ බස්නාහිරට : අංක 536 පිඹුරේ රාමසාමි සහ පුත්‍රයන්ට අයත් ලොට් ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 25.7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක 796/2005 දරන එකී පිඹුරට අනුවය.

එකී ලොට් 7 පහතින් මැනවින් විස්තරකොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී නාරාහේන්පිට පිහිටි නාරාහේන්පිට පාරේ, වරිපනම් අංක 129/1 දරන "පිල්ලෑව කුඹුර ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. කුමාර ස්වාමි විසින් සාදන ලද 1961 පෙබරවාරි මස 22 දාතම හා අංක 255 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 7 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කජුගහ ඕවිට, රජයේ කිරිපට්ටි ගොවිපල, නැගෙනහිරට : ගන්ජිම්මා ඕවිට, රජයේ කිරිපට්ටි ගොවිපල, දකුණට : ලොට් 6 සහ 8 සහ බස්නාහිරට : රාමසාමි සහ පුත්‍රයෝ යන අයට අයත් එන් 536 පිඹුරේ ලොට් ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 25.7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේද එකී අංක 255 දරන පිඹුරට අනුව වෙළුම/පිටුව ඒ 1101/188හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1077/215 හි ලියාපදිංචිකොට ඇති හා අංක 255 එකී පිඹුරේ නිරූපිත ලොට් 8 (පාරක් සඳහා වෙන් කිරීම) දිගේ හා ඒ මතින් මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-734/7

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් සමදරා ජයසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2004.07.14 දිනැති අංක 507 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ මහජන නොතාරිස් ජේ. එල්. සරත්චන්ද්‍ර මහතා විසින් සහතික කරන ලද 2005.08.09 දිනැති අංක 10 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2009.03.25 වැනි දින තෙක් පොළිය වශයෙන් (1) රුපියල් හාරලක්ෂ එකොලොස් දහස් නවසිය පහයි ශත දාසයක (රු. 4,11,905.16) මුදලක් සහ (2) රුපියල් හත්ලක්ෂ පනස් හත් දහස් තුන්සිය තිස්දෙකයි ශත විසිඑකක (රු. 7,57,332.21) මුදලක් සමග ණය ගිණුම මත රුපියල් තුන්ලක්ෂ හැත්තෑනව දහස් නවසිය හැටක (රු. 3,79,960) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොළියක් සහ ණය ගිණුම මත රුපියල් හත්ලක්ෂ දොලොස් දහස් නවසිය දාසයක (රු. 7,12,916) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොළියක් ද, 2009.03.26 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කැස්බෑව, හොරණ පාර, අංක 191/1හි පදිංචි සියඹලාගොඩ කංකානමලාගේ දේවප්‍රිය චන්ද්‍රසිරි සේනාසේකර මහතා සහ සියඹලාගොඩ කංකානමලාගේ මධුභාෂිනි සේනාසේකර මෙනවිය යන දෙදෙනාගෙන් අයවිය යුතුව ඇත.

2. මහජන නොතාරිස් සමදරා ජයසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2004.07.14 වැනි දිනැති අංක 507 දරන එකී බැඳුම්කරය සහ මහජන නොතාරිස් ජේ. එල්. සරත්චන්ද්‍ර මහතා විසින් සහතික කරන ලද 2005.08.09 දිනැති අංක 10 දරන බැඳුම්කරය මත (1) රුපියල් හාරලක්ෂ එකොලොස් දහස් නවසිය පහයි ශත දාසයක (රු. 4,11,905.16) සහ (2) රුපියල් හත්ලක්ෂ පනස් හත් දහස් තුන්සිය තිස්දෙකයි ශත විසිඑකක (රු. 7,57,332.21) මුදල සමග 2009.03.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බදුල්ල, කලුගල්පිටිය, අංක 48/1හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට අයගම ලංකා බැංකු ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙමල්දූව ග්‍රාමයෙහි පිහිටි කොස්ගහලන්ද සහ තල්ගහකනත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එන්. වික්‍රමරත්න විසින් සාදන ලද 2003.10.04 දිනැති අංක 207ඒ දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා නිරූපනය කර ඇති මායිම් නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : බලයලත් මිනින්දෝරු ජේ. එන්. වික්‍රමරත්න විසින් සාදන ලද අංක 207 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : කොළඹ හොරණ පාරට නිවෙස්වල සිට යන පාර ද, දකුණට : කොළඹ හොරණ පාරට නිවෙස්වල සිට යන පාර ද, බස්නාහිරට : ඉහත කී අංක 207 දරන පිඹුරෙහි ලොට් 3හි ඉතිරි කොටස ද, මායිම්ව රූඩ් එකයි, පර්චස් විස්සක (අ. 0, රූ. 1, පර්. 20) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2770/132 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලොට් A ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත සඳහන් ඉඩමෙන් බෙදා මායිම් නිර්ණය කරන ලද කොටසකි :

ඉහත කී දෙමල්දූව ග්‍රාමයෙහි පිහිටි කොස්ගහලන්ද සහ තල්ගහකනත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එන්. වික්‍රමරත්න විසින් සාදන ලද 1994.08.16 දිනැති අංක 207 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස සටහන් කොට නිරූපනය කර මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : කොළඹ හොරණ ප්‍රධාන පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : කොස්ගහලන්ද සහ තල්ගහකනත්ත සහ බලයලත් මිනින්දෝරු වයි. ජී. ද සිල්වා විසින් සාදන ලද 1993.05.19 දිනැති අංක 468 දරන පිඹුරෙහි පාර ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එන්. එස්. ද වීරක්කොඩි විසින් සාදන ලද අංක 2737 දරන පිඹුරෙහි කොස්ගහකනත්ත සහ එකී අංක 207 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 4 (පුද්ගලික පාර) සහ ලොට් 2 ද මායිම් ව අක්කර තුනයි, රූඩ් දෙකයි, පර්චස් දහඅටයි දශම හතයි එකක (අ. 3, රූ. 2, පර්. 18.71) වපසරියකින් යුක්ත අතර එහි ඇති වෙනත් සියලු දේද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2154/193 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. පී. රත්නසේකර මහත්මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
අයගම.

07-740

---

පීවී 62916.

### 2007 අංක 07 දරන සමාගම් පනත

### 394 (3) වගන්තිය යටතේ "ඇඩා සෙල්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.02.01 දින සංස්ථාපිත සමාගමක් වන ඇඩා සෙල්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඇඩා සෙල්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජූනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-586

පීවී 3980.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "උමර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.10.19 දින සංස්ථාපිත සමාගමක් වන උමර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, උමර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-587

---

පීවී 8623.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සබීතා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.02.11 දින සංස්ථාපිත සමාගමක් වන සබීතා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සබීතා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-588

---

පීවී 62609.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "කෙයිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.01.04 දින සංස්ථාපිත සමාගමක් වන කෙයිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කෙයිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-589

---

පීවී 61751.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඒට්කන් ස්පෙන්ස් පවර් කෙරවලපිටිය (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.10.18 දින සංස්ථාපිත සමාගමක් වන ඒට්කන් ස්පෙන්ස් පවර් කෙරවලපිටිය (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඒට්කන් ස්පෙන්ස් පවර් කෙරවලපිටිය (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-590

පීවී 64659.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "වෙන්චරි හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.07.01 දින සංස්ථාපිත සමාගමක් වන වෙන්චරි හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, වෙන්චරි හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-591

---

පීවී 8196.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඉන්ටර්නැෂනල් බිස්නස් වෙන්චර්ස් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.07.22 දින සංස්ථාපිත සමාගමක් වන ඉන්ටර්නැෂනල් බිස්නස් වෙන්චර්ස් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඉන්ටර්නැෂනල් බිස්නස් වෙන්චර්ස් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-592

---

පීවී 61262.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "රැවි ක්‍රියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.09.05 දින සංස්ථාපිත සමාගමක් වන රැවි ක්‍රියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, රැවි ක්‍රියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-593

---

පීවී 60154.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඉන්ඩස්ට්‍රියල් ක්ලෝතිංස් එක්ස්පෝට්ස් ට්‍රේඩිං හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.06.05 දින සංස්ථාපිත සමාගමක් වන ඉන්ඩස්ට්‍රියල් ක්ලෝතිංස් එක්ස්පෝට්ස් ට්‍රේඩිං හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඉන්ඩස්ට්‍රියල් ක්ලෝතිංස් එක්ස්පෝට්ස් ට්‍රේඩිං හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

07-594

පීබී 443.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සී. ටී. සී. (එක්ස්පෝට්ස්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනත (145 අධිකාරය) විධිවිධාන යටතේ 1980.07.17 දින සංස්ථාපිත සමාගමක් වන සී. ටී. සී. (එක්ස්පෝට්ස්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සී. ටී. සී. (එක්ස්පෝට්ස්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-595

---

පීබී 3571.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ස්පෙන්ස් ග්ලෝබල් ලොජිසිටික්ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.10.07 දින සංස්ථාපිත සමාගමක් වන ස්පෙන්ස් ග්ලෝබල් ලොජිසිටික්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ස්පෙන්ස් ග්ලෝබල් ලොජිසිටික්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-596

---

පීබී 3553.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ලංකා ඔරික්ස් ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.07.16 දින සංස්ථාපිත සමාගමක් වන ලංකා ඔරික්ස් ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලංකා ඔරික්ස් ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජුනි මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-597

---

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. ජී. ඊෂා ගුණරත්න විසින් 2008.03.03 දින ලියා සහතික කරන ලද අංක 202 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, කනපැන්දල ගමගේ අසේල ශිරාන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිතුන්ලක්ෂ හැත්තෑතුන් දහස් දෙසිය දහනමයයි ශත හතලිස් දෙකක (රු. 23,73,219.42) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2008.12.31 දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් රුපියල් විසිතුන් ලක්ෂ හැත්තෑතුන් දහස් දෙසිය දහනමයයි ශත හතලිස් දෙකක (රු. 23,73,219.42) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිතුන් ලක්ෂ හැත්තෑතුන් දහස් දෙසිය දහනමයයි ශත හතලිස් දෙකක (රු. 23,73,219.42) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 202 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ, මහ නගර සභා සීමාවේ කුඹල්වැල්ලේ පිහිටි ඩෙනල්ඩ් ජැන්ස් පාර, වරිපනම් අංක 15/4 බී දරන නෝනගෙවත්ත හෙවත් බටගන්විල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මහතා විසින් මැන සාදන ලද 2007.11.27 දිනැති අංක 542/2007 දරන පිඹුර ප්‍රකාර අංක 1 දරන කැබැල්ල බෙදා වෙන් කරන ලද 1[D] සඳහා මායිම් : උතුරට නගර සභා පාර ද, නැගෙනහිරට මෙම ඉඩමේ 1 බී දරන කැබැල්ල ද, (පාර සඳහා වෙන් කළ බිම), දකුණට : මෙම ඉඩමේම 1 ඊ දරන කැබැල්ල ද, සහ බස්නාහිරට : මෙම ඉඩමේ 1 සී දරන කැබැල්ල ද යන මෙකී සතර මායිම් තුල පිහිටි පර්චස් දහඅටයි දශම හයක් (අක්. 0, රූ.0, පර්. 18.6) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියළුම දේ ද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A669/187 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.

07-690

---

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.06.30 දින ලියා සහතික කරන ලද අංක 742 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අතුකෝරල ආරච්චිගේ සඳමාලි, උඩුවක හේවගේ ලක්ෂ්මන් කුලතුංග යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හත්ලක්ෂ පනස්දහසයි ශත දහයක (රු.7,50,000.10) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.11.19 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් හත්ලක්ෂ පනස්දහසයි ශත දහයක (රු.7,50,000.10) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ පනස්දහසයි ශත දහයක (රු.7,50,000.10) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 742 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාලු කඩවත් සතර තුළ කපුහෙම්පොල පිහිටි පුවක්ගහකනත්තවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ කැබලි අංක 07 සඳහා බලයලත් මිනින්දෝරු ඩී. ජී. එච්. ඩයස් විසින් 1942 ජූලි 03 සහ 09 යන දිනයන්හි මැන සම්පාදිත අංක 58 ඒ දරන පිඹුර පරිදි මායිම්, උතුරට : ගොඩදූව දක්වා වන ගම්සභා පාර, වඩාත් නිවරුදිව වැලිපොත සිට අක්මීමන දක්වා දිවෙන පාර, නැගෙනහිරට : මෙම ඉඩමේම අංක 08 දරන කැබැල්ල ද, දකුණට : අංක 09 දරන කැබැල්ල ද, බස්නාහිරට: මෙම ඉඩමේම අංක 06 දරන කැබැල්ල යන සතර මායිම් තුල පිහිටි පර්චස් විසිහයයි දශම අටයි දෙකක් (අක්. 0, රූඩ් 0, පර්. 26.82) ක් විශාල ඉඩම, එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියළු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B124/287 යටතේ ලියාපදිංචි කර ඇත :

ඉහත කී ඉඩම 2005.05.30 දින බලයලත් මානක කේ. ඩී. එන්. වීරසිංහ විසින් නැවත මැන සාදන ලද අංක 1130 දරන පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ කපුහෙන්පොල පිහිටි පුවක්ගහකනත්තවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. එන්. වීරසිංහ මහතා විසින් 2005.05.30 දින මැන සාදන ලද අංක 1130 දරන පිඹුර පරිදි බෙදා වෙන් කරන ලද අංක 07 දරන කැබැල්ලට මායිම් : උතුරට - වැලිපත සිට අක්මීමන දක්වා දිවෙන ගම්සභා පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 8 ද, දකුණට : මෙම ඉඩමේම කැබලි අංක 09 ද, බටහිරට : මෙම ඉඩමේම අංක 06 දරන කැබැල්ල ද යන මෙකී සතර මායිම් තුළ පිහිටි පර්චස් විසිහයයි දශම අටයි දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 26.82) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියලුම දේද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B191/85 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.

07-691

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 292516.

2009 අප්‍රේල් මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් 2005 සැප්තැම්බර් මස 14 වැනි දින සහතික කරන ලද අංක 8541 සහ 2005 සැප්තැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද අංක 8581 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාගමනී නන්තකුමාර් සහ ලතික්කා නන්තකුමාර් ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 1 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම) ද, එසේම යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් 2005 ඔක්තෝබර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 8664 ද, 2005 නොවැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 8743 ද, සහ 2006 අප්‍රේල් මස 10 වැනි දින සහතික කරන ලද අංක 9111 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාගමනී නන්තකුමාර් සහ ලතික්කා නන්තකුමාර් ණයකරුවන්/හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද, එකී බැඳුම්කර යටතේ රුපියල් පනස් පන් ලක්ෂ තිස්අට දහස් දෙසීය හැත්තෑ නවයයි ශත හැට එකක (රු. 5,538,279.61) මුදලක් 2008 නොවැම්බර් මස 14 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස්පන් ලක්ෂ තිස්අට දහස් දෙසීය හැත්තෑ නවයයි ශත හැට එක (රු.5,538,279.61) මුදලට 2008 නොවැම්බර් මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 3,677,392.89 ක මුදල මත 24% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 8541, 8581, 8664, 8743 සහ 9111 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 12, හල්ප්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### 1 වැනි උපලේඛනය

බලයලත් මානක එස්. විස්වරත්නම් විසින් 1994 අගෝස්තු මස 22 වැනි දින සාදන ලද අංක 593 ඒ දරන පිඹුර පරිදි, උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමන් බටහිර කොට්ඨාසයේ, මානිපායි දේවගැති ප්‍රදේශයේ, නවාලි පිහිටි කායඩ්ඩියිවලාවුම් අද්දගිරියුම් කියන ඉඩමේ පිහිටි නිවස, ළිඳ, වගාවන් සහ සියලුදේත් සමග වූ ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : විශ්වානාතාර් වීරසිංහම්ගේ උරුමක්කාරයින්ට අයිති දේපළ ද, උතුරට : මාරුත්අප්පු සුප්පයියාගේ උරුමක්කාරයින්ට අයිති දේපළ සහ තුරෙයිසාමිගේ භාර්යාව වන ගව්රි අම්මාට අයිති දේපළ ද, බස්නාහිරට : තුරෙයිසාමිගේ භාර්යාව වන ගව්රි අම්මාට හිමි දේපළ සහ පටු පාර ද, දකුණට : නඩරාජාගේ දුවනිය වන යෝගේස්වරීට අයිති දේපළ ද, යන මායිම් තුළ 6 එල්එම්එස් විසී සහ 0.94 කුලීස් ප්‍රමාණයෙන් යුත් ඉඩම යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 751/174 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි ව ඇත.

### 2 වැනි උපලේඛනය

බලයලත් මානක ටී. තර්මලිංගම් විසින් 2005 අගෝස්තු මස 18 වැනි දින සාදන ලද අංක 0001 දරන පිඹුර පරිදි, උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් බටහිර කොට්ඨාසයේ, මානිපායි දේවගැති ප්‍රදේශයේ, මානිපායි පිහිටි සුන්ඩිපානයි සහ සුන්ඩිපානයි වලව් නමැති ලොට් 1 සිට 21 දක්වා ප්‍රමාණයෙන් යුත් ඉඩමේ ලකුණුකොට පෙන්වා ඇති ලොට් 14 දරන කොටසට මායිම් නැගෙනහිරට : ලොට් 13 ද, උතුරට : ලොට් 20 ද, බස්නාහිරට : ලොට් 15 ද, දකුණට : සින්නතම්බි මහේෂන්ට සහ තවත් අයට හිමි දේපල යන මායිම් තුළ, 37 එල්එම්එස් විසී සහ 17.95 කුලීස් ප්‍රමාණයෙන් යුත් ඉඩම යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 762/246 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

07-726

---

### ලංකා බැංකුව

#### 1968 අංක 34 දරන පනතින් සහ 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

කුරුණෑගල, විල්ලේගොඩ පාරේ, අංක 31/1 හි පදිංචි තිලකරත්න මුදියන්සේලාගේ ජානකී මල්කාන්ති තිලකරත්න මහත්මිය සහ ලන්සකාර හේරත් මුදියන්සේලාගේ ධර්මරත්න මහතාගේ ණය වගකීම් වෙනුවෙන් උකස් කරන ලද අංක 31 සහ 31/1, විල්ලේගොඩ පාර, විල්ලේගොඩ හි පිහිටි දේපළ.

2009 පෙබරවාරි මස 26 වැනි දින සහ 2009 ජුනි මස 25 යන දිනයන්හි පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම සහ ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 1996.11.12 දිනැති අංක 174, මහජන නොතාරිස්, වසන්ත අමරසේකර විසින් සහතික කළ 2000.04.28 දිනැති අංක 7193, මහජන නොතාරිස් වසන්ත අමරසේකර විසින් සහතික කරන ලද 2000.04.28 දිනැති අංක 7195, මහජන නොතාරිස් එඩ්මන්ඩ් කුලරත්න විසින් සහතික කරන ලද 2002.05.31 දිනැති අංක 6939 සහ මහජන නොතාරිස් එඩ්මන්ඩ් කුලරත්න විසින් සහතික කරන ලද 2007.01.05 දිනැති අංක 11059 දරන උකස් බැඳුම්කර මත මුල් මුදල හා ණය මත 2009.01.31 දින තෙක් හිඟ හිටි පොලිය වශයෙන් රුපියල් හැට එක්ලක්ෂ තිස්දෙදහස් නවසිය හැත්තෑහතයි ශත තිස්පහක (රු.61,32,977.35) මුදලක් සමග රුපියල් හතලිස් පන්ලක්ෂ අසූඅට දහස් හාරසීය අනූතුනයි ශත හැටදෙකක (රු.45,88,493.62) මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් තවදුරටත් පොළියක් ද, 2009.02.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කුරුණෑගල, විල්ගොඩ පාර, අංක 31/1 හි පදිංචි තිලකරත්න මුදියන්සේලාගේ ජානකී මල්කාන්ති තිලකරත්න මහත්මියගෙන් සහ ලන්සකාර හේරත් මුදියන්සේලාගේ ධර්මරත්න මහතා යන දෙදෙනාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 174, 7193, 7195, 6939 සහ 11059 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හැටඑක්ලක්ෂ තිස්දෙදහස් නවසිය හැත්තෑහතයි ශත තිස්පහක (රු. 61,32,977.35) මුදල සමග 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත

උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි කීර්තිමත්, පුරෝගාමී, වරලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, සම්බන්ධතා කළමණාකරු (අයකර ගැනීම් - ආයතනික) ට ද,මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල නගරයේ, නගර සභා සීමා තුළ, පිහිටි විල්ගොඩ පාරේ, වරිපනම් අංක 31/1දරන "විල්ගොඩ මිල්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් සාදන ලද 1994 අප්‍රේල් මස 02 දිනැති අංක 5707 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස නිරූපනය කරන මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම, උතුරට සහ ඊසාන දිගට : ලොට් 2 සහ 1 ද, දකුණට සහ ගිනිකොණට : ලොට් 1 සහ ඩබ්. එන්. ජයසූරියගේ සහ විල්ගොඩ පාරේ වරිපනම් අංක 45/8 දරන වී. ඒ. සංසදාසගේ ඉඩම ද, මායිම්ව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුක්ත වන අතර මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1424/271 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට ඉහත කී විල්ගොඩ පිහිටි "විල්ගොඩ මිල් " නමැති ඉහත කී ඉඩමෙහි අංක 5707 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස නිරූපනය කර ඇති, ඊසාණ දිගට : විල්ගොඩ පාරද, නැගනෙහිරට සහ ගිණිකොණට : ලොට් 1ද, නිරිතට : ලොට් 3 ද, වයඹට : වී. ඒ. සංසදාසට අයත්, විල්ගොඩ පාරේ වරිපනම් අංක 35ද, මායිම් වූ පර්චස් දෙකක (අ. 0, රූ. 0, පර්. 02) වපසරියකින් යුතු වූ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1632/04 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇති පාරෙහි අයිතිය ද ඇත.

2. කුරුණෑගල නගරයේ මහ නගර සභා සීමාව තුළ විල්ගොඩ පාරේ පිහිටි ඉහත කී 'විල්ගොඩ මිල්ස්' නමැති ඉඩමෙහි පෙරකී අංක 5707 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපනය කර මායිම් නිර්ණය කරන ලද බෙදූ ඉඩම් කැබැල්ල එකී පිඹුරට අනුව, ඊසාණ දිගට : විල්ගොඩ පාර ද, ගිණිකොණට : ඩබ්. එන් ජයසූරියගේ ඉඩම ද, නිරිතට : වරිපනම් අංක 31/1 දරන එකී පිඹුරෙහි ලොට් 3 ද, වයඹට : අඩි 10 පළල පාරක් වන එකී පිඹුරෙහි ලොට් 2 ද, මායිම්ව පර්චස් දහඅටක (අ. 0, රූ.0, පර්. 18) වපසරියකින් යුක්ත වන අතර වරිපනම් අංක 31 දරන එහි ඇති සියලු දේද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1632/05 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,<br>
සම්බන්ධතා කළමනාකරු.

2009 ජූනි මස 29 වැනි දින,<br>
ලංකා බැංකුව,<br>
අයකරගැනීමේ ඒකකය,<br>
3 වෙනි මහල,<br>
නවමූලස්ථාන ගොඩනැගිල්ල,<br>
අංක 04, ලංකා බැංකු මාවත,<br>
කොළඹ 01.

07-741

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### කලින් කළ සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500000596.

ණයකරුගේ සම්පූර්ණ නම: නොරොන්සු හළු සුමේධ සංජීව.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 1223 හා 1997.12.26 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූඅටදහස් හාරසිය විසිහතයි ශත හැත්තෑනමයක (රු. 98,427.79) මුදලක් වර්ෂ 2007.02.28 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හයදහස් හයසියතිස්අටයි ශත හැටඅටක (රු. 56,638.68) මුදල ද, 2007.02.28 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස්එක්දහස් හත්සියඅසූනමයයි ශත එකොළහක් (රු. 41,789.11) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූඅටදහස් හාරසියවිසිහතයි ශත හැත්තෑනමයක (රු. 98,427.79) ද,

(2) එකී රුපියල් පනස් හයදහස් හයසිය තිස්අටයි ශත හැට අටක (රු. 56,638.68) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොළියක් 2007.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන යන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ මැයි මස 10 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැද්දකැටිය කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ කන්දෙගෙදර සහ මෙතන්ගරේ ග්‍රාමයන්හි පිහිටි කන්දෙගෙදර නැමැති ඉඩමට 1996.10.15 දින බී. එච්. ඒ ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651 ඒ පිඹුර ප්‍රකාර ලොට් 64

ට මායිම්, උතුරට : පාරට වෙන් කරන ලද ලොට් ආර් 10 ද, නැගෙනහිරට : ලොට් 61 ද, දකුණට : ලොට් 63 ද, බටහිරට : ලොට් 65 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අක්. 0, රූඩ් 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 85/101 හි ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී කන්දෙගෙදර නැමැති ඉඩමට 1996.10.15 දින බී. එච්. ඒ ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651 ඒ පිඹුර ප්‍රකාර ලොට් 65 ට මායිම්, උතුරට : පාරට වෙන්කරන ලද ලොට් ආර් 10 ද, නැගෙනහිරට : ලොට් 64 ද, දකුණට : ලොට් 66 ද, බටහිරට : ලොට් 68 සහ 69 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අක්. 0, රූඩ් 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 85/102 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

07-710